Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පරිසරය ආශ්‍රිත විභාග ප්‍රශ්න

## (2008 – 2019)



නම : ..........................................................................

ශ්‍රේණිය: ..........................................................................

පාසල: ..........................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. 2019 - අගෝස්තු

(1) බීජ මගින් පැළ ලබා ගත හැකි බීජයකි.
1. බතල 2.වැටකොළු 3. රාජ අල 4. මඤ්ඤොක්කා

(2) කුඹුරුවල සිටින හානි කර සතුන් ගොදුරු කර ගන්නා සතෙකි.
1. බකමූණා 2. ගොළුබෙල්ලා 3. ගැඩවිලා 4. සමනලයා

(3) ශ්‍රී ලංකාවේ ඒකදේශික ශාකයකි.
1. මා වේවැල් 2. තේක්ක 3. කොස් 4. කොහොඹ

(4) ශක්ති ජනක කාණ්ඩයට අයත් වන ආහාරයකි.
1. කිරි 2. නිවිති 3. බිත්තර 4. කොස්

(5) බිතු සිතුවම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි.
1. ඉසුරුමුණිය 2. සීගිරිය 3. යාපහුව 5. ගාලු කොටුව

(6) ගෙමැස්සා මගින් රෝග බීජ ශරීරගත වීමෙන් වැළඳෙන රෝගයකි.
1. පාචනය 2. මහාමාරිය 3. බරවා 4. චිකුන්ගුන්යා

(7) ක්ෂීරපායී කාණ්ඩයට අයත් වන සතුන් පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
1. කිරලා, මොනරා, ගවයා, 2. කිඹුලා, හිවලා, අලියා
3. ඉබ්බා, කොටියා, වලහා 4. ගවයා, හිවලා, දිවියා

(8) දියලුම සහ කිරිගල්පොත්ත යනු ශ්‍රී ලංකාවේ පිහිටි
1. ගංගාවක් සහ වනාන්තරයකි. 2. දිය ඇල්ලක් සහ කන්දකි.
3. වැවක් සහ කන්දකි. 4. දිය ඇල්ලක් සහ ගංගාවකි.

(9) ශ්‍රී ලංකාව දූපතක් ලෙස හඳුන්වනු ලබන්නේ,
1. කුඩා රටක් බැවිනි. 2. ඉන්දියාවට ආසන්න ව පිහිටි බැවිනි.
3. ජලයෙන් වට වී ඇති බැවිනි. 4.ගංගා ජලය මුහුදට ගලා යන බැවිනි.

(10) “දිය නැමට අනාරක්ෂිතයි” ලෙස වැවක් අසල දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට අදාළ නොවන කරුණක් වන්නේ කුමක් ද?
1. ජලය බීමට ගැනීම 2. ගැඹුරු ස්ථානයක් වීම.
3. කිඹුලන් සිටීම. 4. මඩ සහිත වීම.

(11) ඇම්බැක්කේ දේවාලය ප්‍රසිද්ධ වී ඇත්තේ,
1. ප්‍රතිමා නිසා ය. 2. ගල් කැටයම් නිසා ය.
3. බිතු සිතුවම් නිසා ය. 4. ලී කැටයම් නිසා ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(12) අයිස් කැටයක් ජලයට දැමූ විට සිදු නොවන්නේ කුමක් ද?
1. අයිස් කැටය ජලයේ දිය වීමයි. 2. ජලයේ පාවීමයි.
3. ජලයෙහි වර්ණය වෙනස් වීමයි. 4. ජලය සීතල වීමයි.

(13) කොන්ඩිස් කුඩු ජලයට එකතු කළ විට ලැබෙන දියරයේ පාට කුමක් ද?
1. රතු 2. කහ 3. දම් 4. කොළ

(14) ශාකයක ප්‍රධාන වශයෙන් ආහාර නිෂ්පාදනය කරනු ලබන්නේ පහත සඳහන් කුමන කොටස තුළ ද?
1. මල් 2. ගෙඩි 3. මුල් 4. පත්‍ර

(15) වේළීමෙන් හා වැලි යට තැබීමෙන් කල් තබා ගත හැකි ආහාරයක් වන්නේ,
1. දෙහි ය. 2. බිලිං ය. 3. සියඹලා ය. 4. ගොරකා ය.

(16) ක්ෂීරපායී සත්ත්වයෙකු හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
1. ශාක ද්‍රව්‍ය පමණක් ආහාරයට ගැනීමයි. 2. මව්කිරිවලින් පැටවුන් පෝෂණය කිරීමයි
3. බිත්තර වලින් පැටවුන් බිහිවීමයි. 4. ගොඩබිම පමණක් දක්නට ලැබීමයි.

(17) විල්බැරෝවෙන් සහ ගිරයෙන් ඉටු කර ගන්නා කාර්යයන් වන්නේ පිළිවෙළින්
1. බරක් රැගෙන යාම හා බෝතල් මූඩි ඉවත් කිරීමයි.
2. ඇණ ගැලවීම හා බෝතල් මූඩි ඉවත් කිරීමයි.
3. ද්‍රව්‍ය කැබලි කිරීම හා ඇණ ගැළවීමයි.
4. බරක් රැගෙන යාම හා ද්‍රව්‍ය කැබලි කිරීමයි.

(18) වගා ආරක්ෂා වීම සඳහා සිදුවන ස්වාභාවික ක්‍රියාවක් වන්නේ කුමක් ද?
1. බෝග වගාව වටා ඉනි වැටක් බැඳීම.
2. පිටි මකුණන් සඳහා සබන් වතුර යෙදීම.
3. ඇටි කුකුළන් විසින් ගොලුබෙල්ලන් ආහාරයට ගැනීම.
4. කොහොඹ ඇට තලා සාදා ගත් දියර ඉසීම.

(19) රාජ්‍ය ලාංඡනයේ ඇති සංකේතවලට අයත් නොවන්නේ,
1. ධර්මචක්‍රය 2. පුන්කලස 3. පළා පෙති 4. පොල් මල්

(20) ශාකයක තිබෙන පත්‍ර යොදා ගනිමින් කූඩු සාදා ගන්නා සතෙකි.
1. ලේනා 2. දිමියා 3. කපුටා 4. වඩුවා

(21) කුස්සියේ භාවිත නොකරන උපකරණයකි.
1. පිහිය 2. හිරමනය 3. දැකැත්ත 4. වංගෙඩිය

(22) සවන් දීමෙන් පමණක් තොරතුරු ලබා ගත හැකි සන්නිවේදන මාධ්‍යය දෙකක් වන්නේ,
1. රූපවාහිනිය සහ පුවත්පතයි. 2. ගුවන් විදුලිය සහ ශබ්ද වාහිනියයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

3. පුවත්පත් සහ ශබ්ද වාහිනියයි. 4. ගුවන් විදුලිය සහ රූපවාහිනියයි.

(23) ශාකවලින් ලබා ගන්නා ආහාරය කුමක් ද?
1. බටර් 2. සෝයා කිරි 3. යෝගට් 4. මුදවපු කිරි

(24) පන්ති කාමරයේ දී කණ්ඩායම් වැඩ කිරීමේ දී ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංගයකි.
1. අවසානය තෙක් කාර්යයෙහි නිරත වීමයි.
2.අන් අයට පෙර තම කාර්යය නිම කිරීමයි.
3. තමන්ගේ අදහස්වලට අනුව පමණක් කාර්යය කිරීමයි.
4. තම කාර්යය කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමයි.

(25) ශ්‍රී ලංකාවේ ජන ක්‍රීඩාවක් වන්නේ පහත සඳහන් කුමන ක්‍රීඩාව ද?
1. අත් පන්දු 2. කැරම් 3. චක්ගුඩු 4. දැල් පන්දු


(26) පසේ ඇති ද්‍රව්‍ය නිරීක්ෂණයට වඩාත් ම උචිත උපකරණය කුමක් ද?
1. සිදුරු කැමරාව 2. මාලිමාව 3. අත් කාචය 4. දුරදක්නය

(27) රූපයේ දැක්වෙන සංකේතයෙන් කියවෙන පණිවිඩය කුමක් ද?




1. ප්‍රවේශමෙන් අල්ලන්න.
2. බිඳෙන සුළු ය.
3. උඩකින් තබන්න.
4. කැඩී ඇත.

(28) රූපයෙන් දැක්වෙන උපකරණය භාවිත කිරීම වඩාත් සුදුසු වන්නේ,



1. යකඩ ඇණයක් ගැසීමසට
2. ඉස්කුරුප්පු ඇණයක් ගැලවීමට
3. තහඩුවක් කපා ගැනීමට
4. තහඩුවක් සිදුරු කිරීමට

(29) රූපයේ දැක්වෙන මැස්ම කුමක් ද?



1. නැටි මැස්ම
2. දම්වැල් මැස්ම
3. බ්ලැන්කට් මැස්ම
4. පිස්මේන්තු මැස්ම

(30) ගෙවතු වගාවේ දී භාවිත කරනු ලබන උපකරණය දැක්වෙන රූපය කුමක් ද?



(1) (2) (3) (4)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. 2018 - අගෝස්තු

(1) ඒක දේශික ශාක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
1. දුම්මල, මා වේවැල්, බිං කොහොඹ
2. අඹ, මා වේවැල්, දෙල්
3. රඹුටන්, අලිගැටපේර, අඹ
4. රඹුටන්, දෙල්, දුම්මල

(2) ජලයෙන්, සුළඟින් සහ සතුන් මඟින් ව්‍යාප්ත වන බීජ පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,
1. හොර, පොල්, අඹ
2. කදුරු, හොර, කජු
3. කදුරු, අඹ,පොල්
4. කජු, අඹ, හොර

(3) පැළෑටිවල කොළ ආහාරයට ගන්නා සතෙකි.
1. මී මැස්සා 2. සමනලයා 3. දළඹුවා 4. බට්ටිච්චා

(4) ඒක දේශික ක්ෂීරපායී සතෙකි.
1. බකමූණා 2. වවුලා 3. හික්මීයා 4. ගස් ගෙම්බා

(5) සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපත් ක්‍රියාවක් වන්නේ,
1. දිමියන් ශාක පත්‍ර එකතු කොට දිමි ගොටු සෑදීම.
2. වවුලන් ශාකවල බීජ තැන තැන දැමීම.
3. ඉත්තෑවන් ශාකවල අල, මුල් ආහාරයට ගැනීම.
4. සමහර වන සතුන් වනයේ ශාක පෙරළා දැමීම.

(6) මැස්සන් නිසා පැතිරීමට ඉඩ ඇති රෝගයකි.
1. මැලේරියාව 2. මහාමාරිය 3. ජලභීතිකාව 4. පාචනය

(7) අපිරිසිදු ජලය පානය කිරීම නිසා ඇති විය හැකි රෝගයකි.
1. බරවා 2. ඩෙංගු 3. කොළරාව 4. චිකුන්ගුන්යා

(8) පහත දැක්වෙන ඒවා අතුරෙන් මේදය වැඩියෙන් ම ඇති ආහාරය තෝරන්න.
1. කඩල 2. සෝයා බෝංචි 3. රට කජු 4. කව්පි

(9) වැසි රහිත දිනවල අළුයම මෙන් ම සැදෑ කාලයේ අහසේ පැහැදිලි ව දිස් වන ග්‍රහ වස්තුව වන්නේ,
1. සිකුරු 2. අඟහරු 3. සෙනසුරු 4.බ්‍රහස්පති

(10) යමෙකු ක්ලාන්ත වූ විටක වහාම කළ යුතු වන්නේ,
1. ශරීරය හොඳින් ආවරණය කිරීමයි.
2. හොඳින් වාතාශ්‍රය ලබා දීමයි.
3. සිසිල් ජලය පානය කිරීමට සැලැස්වීයි.
4. මුඛය තුළට හැන්දක් ඇතුළු කිරීමයි.

(11) පොළොවෙහි වැඩෙන ශාකයක් පෝෂක ලබා ගන්නේ,
1. මුල් මගිනි. 2. පත්‍ර මගිනි. 3. මල් මගිනි. 4. බීජ මගිනි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(12) සෙක්කුව යොදා ගනු ලබන්නේ,

1. ඇණ ගැසීමට  2. කළු ගල් කැඩීමට  3. තෙල් සිඳීමට  4. බර ඇදීමට

(13) මදුරුවන් මර්දනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

1. වටපිටාව පිරිසිදුව තබා ගැනීමයි.  2. මදුරු තලා කොළ පුළුස්සා දුම් ගැසීමයි.
3. ජලය රැස්වන තැන් නැති කිරීමයි.  4. ජලය දැමූ භාජන මත මල් දැමීමයි.

(14) පොළොව මත එකතු වන විවිධ අපද්‍රව්‍ය, කැබලි කොට ඒවා දිරාපත් කිරීමට උදව් වන සතෙකි.

1. ගොලුබෙල්ලා  2. දිමියා  3. වේයා  4. කැරපොත්තා

(15) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව කුමක් ද?

1. දැල් පන්දු  2. අත් පන්දු  3. ක්‍රිකට්  4. එල්ලේ

(16) දඬු කැබලි සිටුවීමෙන් පැළ ලබා ගත හැකි බෝග දෙකකි.

1. මඤ්ඤොක්කා සහ නිවිති  2. බඩ ඉරිඟු සහ මඤ්ඤොක්කා
3. බඩ ඉරිඟ සහ නිවිති  4. මාලු මිරිස් සහ කංකුං

(17) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයෙහි " සෞභාග්‍යය" මූර්තිමත් වීම සඳහා යොදා ඇති සංකේතයකි.

1. පුන්කලස  2. වී කරල්  3. ධර්ම චක්‍රය  4. ඉර සහ හඳ

(18) "දිය හොල්මන" යනු

1. ජලාශ ආශ්‍රිත ව වාසය කරන සත්ත්වයකි.
2. වගා බිම්වල සැරිසරන නිශාචර සත්ත්වයකි.
3. ජනප්‍රවාදයේ ඇති කතාවක අද්භූත චරිතයකි.
4. සතුන්ගෙන් වගා රැක ගැනීමට යොදා ගැනෙන ඇටවුමකි.

(19) පොලීසිය සමහර සෝදිසි කිරීමේ කටයුතු වලදී පුහුණු කරන ලද සුනඛයන් යොදා ගනී. එහි දී ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගනු ලබන්නේ සුනඛයාගේ කුමන ගුණාංගය ද?

1. හොඳින් ඇස් පෙනීම.  2. හොඳින් කන් ඇසීම.
3. තියුණු ඉව  4. වේගයෙන් දිවීම.

(20) බරැති යමක් එක් තැනකින් තවත් තැනකට රැගෙන යෑම සඳහා යොදා නොගැනෙන උපකරණයකි.

1. දොඹකරය  2. විල් බැරෝව  3. කප්පිය  4. ඩැහි අඬුව

(21) අයිස් කැට කිහිපයක් වීදුරුවකට දමා ටික වේලාවක් එළියේ තැබූ විට නිරීක්ෂණය කළ නොහැකි වන්නේ,

1. අයිස් කැට දිය වී ඇති බව  2. වීදුරුවේ ජලය එකතු වී ඇති බවයි.
3. වීදුරුවෙන් වායු බුබුළු පිට වන බවයි.  4. වීදුරුවේ පිටත තෙත් වී ඇති බවයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(22) මහවැලි ගඟ සහ වලවේ ගඟ මුහුදට වැටෙන ස්ථාන දෙක පිළිවෙළින්
1. මඩකලපුව සහ අම්බලන්තොට
2. මඩකලපුව සහ හම්බන්තොට
3. ත්‍රිකුණාමලය සහ කතරගම
4. ත්‍රිකුණාමලය සහ අම්බලන්තොට

(23) පහත දැක්වෙන ක්‍රීඩා අතුරෙන් කායික ශක්තිය වැඩිපුර ම වැය වන ක්‍රීඩාව වන්නේ,
1. දාම් ඇදීම
2. කඹ ඇදීම
3. පංච දැමීම
4. කැරම් ගැසීම

(24) ජාතික ගීය ගායනා කරන විට පැවැත්විය යුතු නිවැරදි ඉරියව්වක් නොවන්නේ,
1. සීරුවෙන් සිටීමයි.
2. පහසුවෙන් සිටීමයි.
3.ශරීරය සෘජුව තබා ගැනීමයි.
4. දෙඇස් විවෘතව තබා ගැනීමයි.


(25) ස්වාභාවික මල් සහ පත්‍රවලින් සුබ පැතුම් පතක් සකස් කිරීමේ පියවර 4ක් මෙසේ ය.
A. වියළා ගත් මල් හා පත්‍ර අවශ්‍ය පරිදි ඇලවීම.
B. අවශ්‍ය ප්‍රමාණයට කඩදාසියක් කපා ගැනීම.
C. ස්වාභාවික මල් සහ පත්‍ර පොතක පිටු අතර වියළෙන්නට තැබීම.
D. සුදුසු සුබ පැතුමක් හෝ ප්‍රාර්ථනාවක් ලිවීම.

1. A, D, C, B
2.B, A, C, D
3. C, B, A, D
4. C, D, A, B

(26) ස්වභාවික සුළ0 බලය යොදා ගැනෙන අවස්ථාවකි.
1. බැලූනයක් පිම්බීම.
2. බටනළාව වාදනය
3. ටයරයකට වායුව පිරවීම.
4. සරු0ගලයක් යැවීම.

(27) රූපයේ දැක්වෙන ලා0ඡනය මඟින් නිරූපණය වන්නේ,
1. ශ්‍රී ලංකා ගුවන් සේවයයි.
2. ශ්‍රී ලංකා රූපවාහිනී ස0ස්ථාවයි.
3. ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීති ගත ස0ස්ථාවයි.
4. ශ්‍රී ලංකා තැපැල් සේවයයි.

(28) A, B, C නම් කුඩා බල්බ තුනක්, යකඩ ඇණ තුනක්, වියළි කෝෂයක්, ලෝහ ඇමුණුම් කටු දෙකක් හා වයර් කැබලි කිහිපයක් යොදාගෙන ලෑලි කැබැල්ලක් මත රූපයේ දැක්වෙන ආකාරයේ ඇටවුමක් සකස් කර ඇත. මෙම ඇටවුම අනුව දැල්වෙන්නේ,






1. A බල්බය පමණි.
2. B බල්බය පමණි.
3. C බල්බය පමණි
4. A, B, C බල්බ තුනම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(29) පහත රූපයෙන් දැක්වෙන මාර්ග සංඥාවෙන් කියවෙන පණිවිඩය කුමක් ද?

1. වර්ණ සංඥා ඉදිරියෙනි.
2. වාහන නවතා තැබීම ඉදිරියෙනි.
3. පහළට බෑවුම් සහිත පාර ඉදිරියෙනි.
4. වසා ඇති පාර ඉදිරියෙනි.






(30) රූපවල දක්වා ඇති මුං බීජ සහිත බඳුන් දින කිහිපයකට පසු නිරීක්ෂණය කළ විට මුං බීජ පැළ වී ඇති බව දක්නට ලැබෙන්නේ කුමන භාජනයේ ද?

1. A  2. B  3. C  4. D

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න._  <u>2017 - අගෝස්තු</u>

(1) වියළාගත් මල් තැම්බීමෙන් ඖෂධීය පානයක් පිළියෙල කිරීමට යොදා ගනු ලබන ශාකයකි.

1. රණවරා  2. කෝපි  3. කොත්තමල්ලි  4. තේ

(2) ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළක් පිහිටන පළාතකි.

1. සබරගමු පළාත  2. මධ්‍යම පළාත  3. ඌව පළාත  4. වයඹ පළාත

(3) කුඹුරු ගොවිතැනේ දී භාවිත කරනු ලබන උපකරණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. උදැල්ල, සකපෝරුව, වියගහ
2. වියගහ, දෑකැත්ත, නගුල
3. නගුල, සෙක්කුව, දැති පෝරුව
4. අතංගුව, උදැල්ල, දෑකැත්ත

(4) විද්‍යුත් චුම්භකයක් භාවිත කරන නිර්මාණයකි.

1.හුමාල බෝට්ටුව  2. සුළං දිශා දර්ශකය  3. විදුලි සීනුව  4.සිදුරු කැමරාව

(5) ජලයේ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

1. නිශ්චිත හැඩයක් තිබීම.
2. රත් කිරීමේ දී හුමාලය පිටවීම.
3. කොන්ඩිස් කුඩු මගින් වර්ණ ගැන්වීම.
4. සිසිල් කළ විට අයිස් බවට පත්වීම.

(6) අමුවෙන් කපාගත් කැබලි කිහිපයක් දැමීමෙන් භාජනයක ඇති ජලය වර්ණ ගැන්විය හැකි එළවළුවකි.

1. වම්බටු  2. වට්ටක්කා  3. කැරට්  4. බීට්රූට්

(7) ඉහළ අහසේ පියාසර කරන තියුණු ඇස් යුගලක් සහිත මාංශභක්ෂක පක්ෂියකි.

1. ඇටිකුකුළා  2. උකුස්සා  3. බකමූණා  4. වැහැළිහිණියා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(8) සුළඟ මගින් වැඩි වශයෙන් පාංශු ඛාදනයට ලක් වන්නේ,
1. උස් ශාක සහිත වනාන්තර ප්‍රදේශ ය. 2. ගොඩනැගිලි බහුල නාගරික ප්‍රදේශ ය.
3. තණකොළ නොමැති වැලි සහිත ප්‍රදේශ ය. 4. තේ පඳුරු සහිත කඳුකර ප්‍රදේශ ය.

(9) පහත සඳහන් තරු රටා අතුරෙන් වැඩි ම තරු සංඛ්‍යාවක් අයත් වන තරු රටාව කුමක් ද?
1. දඩයක්කාරයා 2. මහවලහා 3. දකුණු කුරුසය 4. ගෝනුස්සා

(10) "ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට - කන්නේ කරවලයි රට හාලෙයි බතට" යන කවිය,
1. ගොයම් කවියකි. 2. කරත්ත කවියකි. 3. පාරු කවියකි. 4. පතල් කවියකි

(11) නෝට්ටු මුහුණතේ නොරොච්චෝලෙයි විදුලි බලාගාරය දැක්වෙන ශ්‍රී ලංකා මුදල් නෝට්ටුව වන්නේ,
1. රුපියල් 20 වේ. 2. රුපියල් 50 වේ. 3. රුපියල් 100 වේ. 4. රුපියල් 500 වේ.

(12) ශ්‍රී ලංකාවට වඩාත් ආසන්නව පිහිටා ඇති රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මාලදිවයින, නේපාලය, භූතානය 2. පාකිස්ථානය, ජපානය, බංග්ලාදේශය
3. ඉන්දියාව, රුසියාව, නේපාලය 4. බංග්ලාදේශය, චීනය, මාලදිවයින

(13) කෘත්‍රිම වර්ණක හා රසකාරක යොදන ලද ආහාර භාවිතයෙන් ඇති විය හැකි රෝගයකි.
1. ජලභීතිකාව 2. පිළිකා 3. උණසන්නිපාතය 4. දියවැඩියාව

(14) ඩෙංගු රෝගයෙන් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයකි.
1. උණු කර නිවා ගත් ජලය පානය කිරීම. 2. පිසූ ආහාර හොඳින් වසා තැබීම.
3. අවට පරිසරය පිරිසිදු කිරීම. 4. එළවළු වැඩිපුර ආහාරයට ගැනීම.

(15) අපේ රටේ පොදු ප්‍රවාහන බස් රථයක පූජ්‍ය පක්ෂයට හැරුණු විට මගී ආසන වෙන්කර ඇති අනෙක් පුද්ගල කාණ්ඩ දෙක මොනවා ද?
1. ළදරුවන්, රෝගීන් 2. රෝගීන්, පාසල් සිසුන්
3. ආබාධිතයින්, ගැබිණි මව්වරුන් 4. වයස්ගත වැඩිහිටියන්, ආබාධිතයින්

(16) තවාන්වලින් පැළ ලබාගෙන පාත්තිවල සිටුවනු ලබන බෝග වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. බෝංචි, බණ්ඩක්කා, නිවිති 2. බෝංචි, තක්කාලි, මාළුමිරිස්
3. වම්බටු, නිවිති, තක්කාලි 4. මාළුමිරිස්, වම්බටු, තක්කාලි

(17) මාර්ග වර්ණ සංඥා පුවරුවක ඉහළ සිට පහළට වර්ණ සංඥා පිහිටන නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.
1. රතු, කහ, කොළ 2. කොළ, කහ, රතු
3. කහ, රතු, කොළ 4. කහ, කොළ, රතු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(18) “මයිනහම” භාවිත කරන්නේ,
1. වඩුවා ය. 2. ධීවරයා ය. 3. පෙදරේරුවා ය. 4. කම්මල්කරුවා ය.

(19) සුළඟ ආධාරයෙන් ක්‍රියාකරන සංගීත භාණ්ඩයක් වන්නේ,
1. බුම්මැඩිය 2. හොරණෑව 3. දවුල 4. උඩැක්කිය

(20) ශ්‍රී ලංකාවේ සෑම රජයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවකට ම නොමිලේ රජයෙන් ලබා දෙන්නේ,
1. නිල ඇඳුම් හා දිවා ආහාර ය. 2. දිවා ආහාර හා පෙළ පොත් ය.
3. පෙළපොත් හා නිල ඇඳුම් ය. 4. ශිෂ්‍යාධාර හා දිවා ආහාර ය.

(21) පිපිරී ඇට වැටීමෙන් ව්‍යාප්ත වන බීජ සහිත ශාකයකි.
1. බඩ ඉරිඟු 2. හොර 3. පුවක් 4. මදටිය

(22) පිටිය මැද සවි කරන ලද දැලක දෙපැත්තේ සිට කරනු ලබන ක්‍රීඩා දෙකකි.
1. නෙට්බෝල්, බැඩ්මින්ටන් 2. වොලිබෝල්, බැඩ්මින්ටන්
3. නෙට්බෝල්, බාස්කට්බෝල් 4. වොලිබෝල්, නෙට්බෝල්

(23) කුරුටු ගී හා බිතු සිතුවම් දක්නට ලැබෙන ඓතිහාසික ස්ථානයකි.
1. සීගිරිය 2. යාපහුව 3. ඉසුරුමුණිය 4. ඇම්බැක්කේ

(24) නිවසක් තුළ ස්වභාවිකව සිසිල් සුළං ලබා ගැනීමට භාවිත කරනු ලබන ක්‍රමයක් නොවන්නේ,
1. නිවෙස්වලට ජනෙල් සවි කිරීම. 2. විදුලි පංකා භාවිත කිරීම.
3. බිත්තියේ ඉහළින් වා කවුළු තැබීම. 4. දොර උළුවස්සේ ඉහළින් බීරළු දැමීම.

(25) ශාකවලට හානි කරන සතුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. දිමියා, කුහුඹුවා, මී මැස්සා 2. කැරපොත්තා, ගෙමැස්සා, මකුණා
3. පුරුක් පණුවා, කුඩිත්තා, පිටිමකුණා 4. මකුණා, උකුණා, කිනිතුල්ලා

(26) පහත සඳහන් ආහාර ද්‍රව්‍ය අතුරෙන් නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර අඩු ම කාලයක් ඇත්තේ කුමකට ද?
1. ටින් මාළු 2. යෝගට් 3. ජෑම් 4. චීස්

(27) පිටරට සිටින ඔබගේ පැනේ මිතුරෙකු දළදා පෙරහැරේ පින්තූරයක් හැකි ඉක්මනින් එවන ලෙස ඔබගෙන් ඉල්ලීමක් කරයි. මේ සඳහා ඔබට යොදා ගත හැකි වඩාත් ම සුදුසු ක්‍රමය මේවායින් කුමක් ද?
1. ගුවන් තැපෑල 2. මුහුදු තැපෑල 3. ශීඝ්‍රගාමී තැපෑල 4. විද්‍යුත් තැපෑල

(28) අතීතයේ අප රට යටත් කරගෙන සිටි විදේශීය ජාතීන් අනුපිළිවෙළින් ඇති පිළිතුර වන්නේ,
1. පෘතුගීසින්, ලන්දේසින්, ඉංග්‍රීසින් 2. ලන්දේසීන්, පෘතුගීසින්, ඉංග්‍රීසින්
3. ඉංග්‍රීසින්, පෘතුගීසින්, ලන්දේසීන් 4. පෘතුගීසින්, ලන්දේසීන්, ඉංග්‍රීසීන්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(29) "යුතුකම් ඉටු කරන්නට හා පුංචි පුංචි වගකීම් දරන්නට මගේ හිතේ ඇති වුණු උනන්දුව මගේ පවුලේ හැමෝගේ ම සිත්වලට ඇතිවේවා! " මෙම සිතුවිල්ල සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක කුමන පියවරට අයත් වේ ද?
1. මානසික ලිහිල් බව 2. අධිෂ්ඨානය 3. ප්‍රාර්ථනාව 4. උදානය

(30) ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වශයෙන් වලිකුකුළා තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ,
1. මෙරට බහුලව සිටීමයි. 2. මෙරටට ආවේණික වීමයි.
3. සෑම ප්‍රදේශයක ම දක්නට ලැබීමයි. 4. වඩාත් ප්‍රයෝජනවත් වීමයි.

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. 2016 - අගෝස්තු

(1) රෝස පාට දලු හට ගන්නා ශාකයකි.
1. දෙහි 2. නා 3. බුලත් 4. කොස්

(2) එක් බීජයක් පමණක් තිබෙන පලතුරකි.
1. නෙල්ලි 2. දිවුල් 3. මැංගුස් 4. දෙළුම්

(3) කාල නියමයක් නොමැතිව වසර පුරා ම මල් පිපෙන්නේ පහත සඳහන් කුමන ශාකයේ ද?
1. රබර් 2. පොල් 3. එරබදු 4. රඹුටන්

(4) ශාක පත්‍ර ආහාරයට ගන්නා සතෙකි.
1. බකමූණා 2. උකුස්සා 3. සමනලයා 4. ගොලුබෙල්ලා

(5) බොහෝ විට ඇඳුම්වල හෝ සතුන්ගේ ශරීරවල හෝ ඇලවී ව්‍යාප්ත වන බීජයකි.
1. හොර 2. තුත්තිරි 3. කූඩලු 4. වරා

(6) කැටයම් කරන ලද සත්ත්ව පේළි ද සහිත විශිෂ්ට කලාත්මක නිර්මාණයකි.
1. සෙල්ලිපිය 2. පුන්කලස 3. සඳකඩපහන 4. පුරාවිද්‍යා ලාංඡනය

(7) ශ්‍රී ලංකාවේ පිහිටි පූජනීය නොවන ඓතිහාසික ස්ථානයකි.
1. රුවන්වැලිසෑය 2. ගාලු කොටුව 3. ශ්‍රී පාදය 4. ථූපාරාමය

(8) ශ්‍රී ලංකාවට නැගෙනහිරින් පිහිටා ඇති රටකි.
1. මැලේසියාව 2. ඉන්දියාව 3. එංගලන්තය 4. ග්‍රීසිය

(9) දැති රෝද සහිත උපකරණයකි.
1. බයිසිකලය 2. විල්බැරෝව 3. හිරමනය 4. විදුලි පංකාව

(10) අත් ආවරණ සහ පා ආවරණ පළඳින්නේ පහත සඳහන් කවර ක්‍රීඩාවේදී ද?
1. එල්ලේ 2. අත්පන්දු 3. ක්‍රිකට් 4. බැඩ්මින්ටන්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(11) “දිය හොල්මන” ප්‍රයෝජනවත් වන්නේ කා හටද?
1. ගොවියාට 2. කිමිදුම්කරුවාට 3. ධීවරයාට 4. පිහිනුම් ක්‍රීඩකයාට


(12) පෞද්ගලිකව ම පරිහරණය කළ යුතු භාණ්ඩ වර්ග දෙකකි.
1. දුරකථනය, පෑන 2. පනාව, දත් බුරුසුව
3. පනාව, කුඩය 4. කුඩය, දත් බුරුසුව

(13) පහත දී ඇති රූපවලින් “මහවලසා” තරු රටාව පෙන්වන රූපය තෝරන්න.



(1) (2) (3) (4)

(14) හිරුඑළිය ඇති ස්ථානයක රූපයේ දක්වා ඇති උපකරණ තබා ඇති ජල භාජනයේ ඇති ජලය උණුසුම් කර ගත හැකි ය. මෙහි දී භාජනය ලෙස භාවිත කළ හැක්කේ,




1. හොඳින් දිලිසෙන ඇලුමිනියම් තාච්චියක්
2. අලුත් මැටි වළඳක්
3. විශාල ඝනකමක් ඇති වීදුරු කෝප්පයක්
4. ප්ලාස්ටික් බේසමක්

(15) ශරීරය වර්ධනය කිරීම සඳහා වැඩි ම දායකත්වයක් සැපයෙන ආහාර ද්‍රව්‍ය කාණ්ඩයකි.
1. බත්, සීනි, මුං ඇට 2. පරිප්පු, නිවිති, ගොටුකොළ
3. පරිප්පු, මුං ඇට, සෝයා බෝංචි 4. අඹ, අන්නාසි, දොඩම්

(16) මස් කල් තබා ගැනීමට භාවිත කළ පැරණි ක්‍රමයකි.
1. ලුණු ද්‍රාවණයක ගිල්වා තැබීම. 2. තැම්බීම.
3. මී පැණිවල ගිල්වා තැබීම. 4. රසකාරක එකතු කිරීම.

(17) අතීත රජවරුන් විසින් කරන ලද වාරි කර්මාන්ත මගින් අපේ රටේ ප්‍රධාන වශයෙන් කළ නිෂ්පාදනයකි.
1. තේ 2. ලුණු 3. එළවළු 4. සහල්

(18) ජලභීතිකා රෝගය වැළඳීමට හේතු වන රෝග බීජ මිනිස් සිරුරට ඇතුළු විය හැක්කේ,
1. මදුරුවාගෙනි. 2. කැරපොත්තාගෙනි. 3. බළලාගෙනි. 4. ගෙමැස්සාගෙනි.

(19) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන වසංගත රෝග වැඩි සංඛ්‍යාවක් සඳහා හේතු වන සත්ව වර්ගය,
1. මීයන් ය. 2. බල්ලන් ය. 3. මදුරුවන් ය. 4. මැස්සන් ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(20) ප්‍රසිද්ධ ලේඛකයෙකු සහ තාරකා විද්‍යාඥයකු ලෙස ලෝකයට විශිෂ්ට සේවාවක් සිදු කළ අයෙක් වන්නේ,
1. ශ්‍රීමත් ආතර් සී. ක්ලාක්
2. ශ්‍රීමත් ඩී. බී. ජයතිලක
3. ආචාර්ය ටී.බි. ජයා
4. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි

(21) ශ්‍රී ලංකාවට ප්‍රථම වරට ඔලිම්පික් පදක්කමක් හිමි කර දුන්නේ කවු ද?
1. සුසන්තිකා ජයසිංහ
2. ඩන්කන් වයිට්
3. ජුලියන් බෝලිං
4. දීපිකා චන්මුගම්

(22) සමාජ විරෝධි ක්‍රියාවක් නොවන්නේ පහත සඳහන් කවරක් ද?
1. මත්ද්‍රව්‍ය වෙළඳාම.
2. ළමයින් සේවයට යොදවා ගැනීම.
3. දුම්රිය පොළෙහි දුම්පානය කිරීම.
4. බස් රථ තුළ ආහාර ද්‍රව්‍ය විකිණීම.

(23) වැවක් පිහිටන ස්ථානයක් සලකුණු කිරීමට ශ්‍රී ලංකා සිතියම්වල යොදා ගන්නේ,
1. නිල් පාට දිග රේඛාවකි.
2. එක් ස්ථානයකට සම්බන්ධ කළ නිල්පාට රේඛාය.
3. නිල් පාටින් පාට කළ කුඩා ප්‍රදේශයකි.
4. නිල් පාට රේඛාවක් මත යෙදූ තිතකි.

(24) පාසල් වත්තේ මිරිස් පාත්තියක් සකස් කිරීමට තෝරා ගත යුත්තේ,
1. හිරුඑළිය අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු සහිත බිමකි.
2. බොරලු සහිත ජලය බැස යන තැනිතලා බිමකි.
3. හිරුඑළිය හොඳින් ලැබෙන ජලය බැස යන බොරලු රහිත තැනිතලා බිමකි.
4. හිරුඑළිය ඉතා අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු රහිත තැනිතලා බිමකි.

(25) යම් පුද්ගලයෙකුට දේදුන්නක් දර්ශනය විය හැක්කේ පහත සඳහන් කුමන අවස්ථාවේ ද?
1. අකුණු සමග අධික වර්ෂාව ඇති විට
2. හිරුඑළිය සමග වියළි සළඟ ඇති විට
3. හිරුඑළිය සමග යාන්තමින් වර්ෂාව ඇති විට
4. අධික වැසි සමග සුළඟ ඇති විට

(26) විදුහල්පතිවරයෙකුට පාසල් වේලාව තුළ දී හදිසි රැස්වීමක් සඳහා ගුරුවරුන් සහ සිසුන් ප්‍රධාන ශාලාවට රැස් කර ගැනීමට අවශ්‍යව ඇත. පාසලේ සියලුම පහසුකම් තිබේ නම් රැස්වීමට පැමිණෙන ලෙස සියලු දෙනාට ම එකවර දැනුම් දීමට විදුහල්පතිවරයාට යොදා ගත හැකි සන්නිවේදන මාධ්‍ය කුමක් ද?
1. දුරකතනය
2. පරිගණකය
3. දැන්වීම් පත්‍රිකාව
4. ශබ්ද වාහිනිය

(27) මාර්ග නීති රීතිවලට අනුව, ශ්‍රී ලංකාවේ මහා මාර්ගවල ධාවන මාර්ග මත රේඛා ඇඳීමට භාවිත කරන වර්ණ මොනවා ද?
1. කහ, කළු
2. කළු, සුදු
3. කහ, සුදු
4. කහ, රතු

(28) ශ්‍රී ලංකාව තුළ පොදු වාහන මගින් සිදු කරන ගමනාගමන සේවය, මහජනයාට හිතකර සේවයක් වීම සඳහා පහත කුමන යෝජනාව ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍ය වේ ද?
1. නියමිත කාල සටහනකට අනුව සියලුම පොදු වාහන ධාවනය කිරීම.
2. පොදු වාහන තුළ රූපවාහිනී සහ ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම.
3. දහවල් කාලය තුළ පොදු වාහන ධාවනය තහනම් කිරීම.
4. ධාවනය වීමේ දී නැවතුම් ස්ථාන කිහිපයක පමණක් පොදු වාහන නතර කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(29) ගිනි ගැනීමකින් ශරීරයේ යම් ස්ථානයක් පිළිස්සුණු පුද්ගලයෙකුට ප්‍රථමාධාර ලබා දීමේ දී අප විසින් පළමුව කළ යුතු දෙය කුමක් ද?
1. පිළිස්සුණු ස්ථානයට ඇලී ඇති ඇඳුම් ඉවත් කිරීම.
2. පිළිස්සුණු ස්ථානය මත තෙල් වර්ග ආලේප කිරීම.
3. දිය බිබිලි මත ආලේපන වර්ගයක් දැල්වීම.
4. පිරිසිදු ඇල් දියෙන් පිළිස්සුණු ස්ථානය සිසිල් කිරීම.

(30) "සෞභාග්‍යවත් ස්වයංපෝෂිත රටක ඉර හඳ පවත්නා තාක්කල් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා" මෙම අදහස් පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාවේ,
1. ජාතික කොඩියෙනි. 2. රාජ්‍ය ලාංඡනයෙනි.
3. ජාතික වෘක්ෂයෙනි. 4. ජාතික ගීයෙනි.

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. <u>2015 - අගෝස්තු</u>

(1) බොහෝ සුවඳවත් මලකි.
1. සේපාලිකා 2. ඇන්තූරියම් 3. වද 4. බෝගන්විලා

(2) වැල්වල සෑදෙන පලතුරු වර්ගයකි.
1. නෙල්ලි 2. මිදි 3. දෙළුම් 4. දිවුල්

(3) අතුවල මෙන් ම කඳෙහිද ගෙඩි හට ගන්නා ශාකයකි.
1. කොස් 2. වෙරළු 4. මංගුස් 4. රබර්

(4) අලංකාරය සඳහා තබන ලද මල් බඳුනක, මල්, වැඩි දින ගණනක් හොඳින් තබා ගැනීමට මල් බඳුනේ ඇති ජලයට එකතු කිරීමට සුදුසු ද්‍රව්‍යය කුමක් ද?
1. අසමෝදගම් 2. ඕඩිකොලොන් 3. ලුණු 4. ඇස්ප්‍රින්

(5) ශ්‍රී ලංකාවේ ඒකදේශික ක්ෂීරපායී සතෙකි.
1. කැහිබෙල්ලා 2. ගල්පාඩියා 3. කළු වඳුරා 4. පිඹුරා

(6) ශක්තිය වඩවන ආහාරයකි.
1. නිවිති 2. බෝංචි 3. බණ්ඩක්කා 4. දෙල්

(7) මීයාගේ ඇඟේ වසන මැක්කෙකු මගින් බෝවන රෝගය කුමක් ද?
1. පාචනය 2. බරවා 3. ජලභීතිකාව 4. මහාමාරිය

(8) වගාවලට හානි කරන ගොලුබෙල්ලන් ආහාරයට ගන්නා සතෙකි.
1. මුගටියා 2. ඇටිකුකුළා 3. ඉත්තෑවා 4. නයා

(9) ඇඹුල් දැමීම නුසුදුසු වන්නේ, පහත සඳහන් කුමන භාජනයක ආහාර සකස් කරන විට ද?
1. මැටි භාජනයක 2. ඇලුමිනියම් භාජනයක
3. ප්ලාස්ටික් භාජනයක 4. වීදුරු භාජනයක

(10) මදුරුවන් අප වෙත ළං වීම වැළැක්වීම සඳහා ශරීරයේ තැවරීමට සුදුසු තෙල් වර්ගයකි.
1. එළවළු තෙල් 2. තල තෙල් 3. පැඟිරි තෙල් 4. පොල් තෙල්

(11) ගැඹුරු ළිඳකින් ජලය ඉහළට ගැනීම සඳහා භාවිත කරන වැඩ පහසු කිරීමේ යන්ත්‍රය වන්නේ,
1. ජල රෝදය 2. දැති රෝදය 3. කරාමය 4. කප්පිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(12) මහවැලි ගඟ මුහුදට වැටෙන ස්ථානයට ආසන්න ම නගරය කුමක් ද?
1. ත්‍රිකුණාමලය 2. මඩකලපුව 3. මුලතිව් 4. පුත්තලම



(13) කොට්ට උරයකට, රූපයේ දැක්වෙන පරිදි මලක් මැසීමේ දී මල් පෙති වටේට යෙදිය යුතු මැස්ම කුමක් ද?

1. දම්වැල් මැස්ම 2. නැටි මැස්ම 3. බ්ලැන්කට් මැස්ම 4. කතිර මැස්ම

(14) ලී කැටයම්වලට ප්‍රසිද්ධ ස්ථානයකි.
1. යාපහුව බලකොටුව 2. ලෝවාමහාපාය 3. ඇම්බැක්කේ 4. ඉසුරුමුණිය

(15) සියලුම ආගමික බැතිමතුන් වැඳපුදා ගන්නා ශ්‍රී පාද ස්ථානය පිහිටි පළාත කුමක් ද?
1. ඌව 2. මධ්‍යම 3. නැගෙනහිර 4. සබරගමුව

(16) ශ්‍රී ලාංකික ජනතාව නිදහස් දිනය සමරනු ලබන්නේ,
1. ජනවාරි 01 2. පෙබරවාරි 04 3. අප්‍රේල් 13 4. මැයි 01


(17) ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ සහ රාජ්‍ය ලාංඡනය යන දෙකේ ම ඇති සංකේතයකි.
1. පළාපෙති 2. පුන්කලස 3. බෝපත් හතර 4. කඩුව රැගත් සිංහයා

(18) සෑම ශ්‍රී ලාංකික මුදල් නෝට්ටුවක ම දැකිය හැකි පොදු ලක්ෂණයකි.
1. පුන්කලසක රූපයක් තිබීම. 2. ශ්‍රී ලංකා මහ බැංකුව ලෙස සටහන් කර තිබීම.
3. දිය ඇල්ලක රූපයක් තිබීම. 4. නෝට්ටුවේ අගය සිංහලෙන් සහ දෙමළෙන් ලියා ඇත

(19) ඔලිම්පික් කොඩියේ ඇති රවුම්වල වර්ණ තුනක් සඳහන් ඇති පිළිතුර කුමක් ද?
1. රතු, නිල්, කහ 2. රතු, කළු, දම් 3. කළු, කොළ, දුඹුරු 4. නිල්, සුදු, රතු


(20) ආහාර ගැනීම සම්බන්ධ ව අප තුළ තිබිය යුතු හොඳ පුරුද්දකි.
1. ක්ෂණික ආහාර නිතර ගැනීම.
2. පැණි රස ආහාර නිතර අනුභව කිරීම.
3. ප්‍රධාන ආහාර වේල් සඳහා පලා වර්ගයක් එකතු කර ගැනීම.
4. විවේකයක් ලැබෙන සෑම විට ම ආහාර අනුභව කිරීම.

(21) ආපනශාලාවක තබා ඇති, රූපයේ දැක්වෙන (1) සහ (2) භාජනවලට දැමීමට සුදුසු ද්‍රව්‍ය දෙකක් පිළිතුර තෝරන්න.



1. කෙසෙල් ලෙලි, කඩදාසි 2. ඉතිරි වූ ආහාර, කඩදාසි
3. කඩදාසි, යෝගට් කෝප්ප 4. යෝගට් කෝප්ප, බෝතල් මූඩි


(22) “පළල් මාර්ග” පෙන්නුම් කිරීමට භාවිත කරන රූපික ප්‍රකාශනය කුමක් ද?



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(23) තොරතුරු සජීව ලෙස ද අපට ලබා දෙන මාධ්‍යයකි.
1. පුවත්පත 2. අත් පත්‍රිකා 3. ගුවන්විදුලිය 4. දැන්වීම්


(24) ඉවත දමන වැහි පිහිල්ලක් බෝග වගාවට යොදා ගෙන ඇති ආකාරය පහත රූපයෙන් දැක්වේ. මෙම විකල්ප ක්‍රමය පිළිබඳ ව පහත සඳහන් කුමක් නිවැරදි ද?



1. සාත්තු කිරීම අපහසු ය.
2.එකම ස්ථානයක තබා වගා කළ යුතුය
3. සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම අපහසු ය.
4. ඉඩකඩ සීමා තැන්වල බෝග වගාවට සුදුසු ය.

(25) තැපැල් පෙට්ටියක සටහන් කර ඇති දෙයකි.
1. විවෘත කරන්නාගේ නම 2. ලිපියකට තිබිය හැකි වැඩි ම බර
3. ලිපි ගන්නා වේලාව 4. ලිපි ගන්නා දිනය

(26) A හා B කුඩා වීදුරු දෙකකට, මුං බීජ සමාන ප්‍රමාණයක් දමා ඇති අතර බීජ හොඳින් වැසෙන පරිදි A වීදුරුවට ජලය දමා ඇත. B වීදුරුවේ බීජ තෙත පුළුන් මත තැන්පත් කර ඇත. එම වීදුරු දෙක හිරුඑළිය ඇති ස්ථානයක තබා, දින කිහිපයකින් පරීක්ෂා කළ විට ලැබෙන නිරීක්ෂණය කුමක් විය හැකි ද?




1. A වීදුරුවේ බීජ හොඳින් පැළ වේ.
2. B වීදුරුවේ බීජ හොඳින් පැළ වේ.
3. A හා B වීදුරුවේ බීජ හොඳින් පැළ වේ.
4. A හා B වීදුරුවේ බීජ හොඳින් පැළ නොවේ.

(27) විදුලි බුබුළ නිපදවීමේ ගෞරවය හිමි වන්නේ,
1. ජෝන් ලොගී බෙයාර්ඩ් මහතාට ය. 2. තෝමස් අල්වා එඩිසන් මහතාට ය.
3. ආතර්.සී. ක්ලාක් මහතාට ය. 4. අලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් මහතාට ය.

(28) අනතුරක් සිදු වීමට වඩාත් ම ඉඩ ඇත්තේ,
1. සංඥා එළි පුවරුවක රතු පාට මිනිසා දිස්වෙමින් තිබිය දී කහ ඉර මතින් වාහන යෑම.
2. අකුණු අවස්ථාවක නිවස තුළ ලී ඇඳක් මත සිටීම.
3. ක්‍රීඩා උත්සවයක් අවසන් වූ විට රතිඤ්ඤා පත්තු කිරීම.
4. වියළි රබර් පාපිස්සක් මත සිටගෙන විදුලි ඉස්ත්‍රික්කයෙන් ඇඳුම් මැදීම.

(29) පුද්ගලයෙකුගේ පාදයට සර්පයෙක් දෂ්ට කර ඇති අවස්ථාවක, එම පුද්ගලයාට ප්‍රථමාධාර ලබා දීමේ දී මුලින් ම කළ යුතු වන්නේ,
1. සර්පයා සොයා හඳුනාගැනීම.
2. දෂ්ට කළ ස්ථානය පිරිසිදු ඇල් ජලයෙන් සේදීම.
3. වෙළුම් පටි මගින් පාද දෙක ගැට ගසා නොසොලවා තැබීම.
4. උණු පානයක් දීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(30) " මම මගෙන් ඉටු විය යුතු යුතුකම් නිවසටත්, පාසලටත්, රටටත් ඉටු කරන දරුවෙක් වෙමි."
මෙසේ සිතීම, සිත් පහන් කිරීම ක්‍රියාකාරකමේ කී වැනි පියවරට අයත් වේ ද?
1. පළමුවැනි 2. දෙවැනි 3. හතරවැනි 4. පස්වැනි

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. 2014 - අගෝස්තු

(1) ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා,
1. කොවුලා 2. ගිරවා 3. වලිකුකුළා 4. පරෙවියා

(2) ජලයෙහි පමණක් ජීවත් වන සතෙකි.
1. ඉබ්බා 2. ඉස්සා 3. ගෙම්බා 4. තාරාවා

(3) රාත්‍රියට පමණක් පිපෙන මල් වර්ගයකි.
1. සේපාලිකා 2. සූරියකාන්ත 3. වද මල් 4. රෝස මල්

(4) පහත සඳහන් කුමන ශාකය ස්වාභාවිකව ම අපට රසවත් පානයක් සකස් කර දෙයි ද?
1. දොඩම් 2. දෙහි 3. තැඹිලි 4. දිවුල්

(5) ආර්ථික වාසි ලබා දෙන නිෂ්පාදනයක් සිදු කරන්නේ පහත සඳහන් කුමන සත්ත්වයා ද?
1. මී මැස්සා 2. සමනලයා 3. පළගැටියා 4. කුඹලා

(6) කරල් හට ගන්නා ශාකයකි.
1. මෑ 2. දඹල 3. බණ්ඩක්කා 4. බෝංචි

(7) ශරීරය වර්ධනය කරන ආහාරයකි.
1. බත් 2. කැරට් 3. අන්නාසි 4. මුං ඇට

(8) කොම්පෝස්ට් පොහොර සෑදීමට යොදා ගත හැකි ද්‍රව්‍යයකි.
1. පොලිතීන් 2. කොළ රොඩු 3. ටින් කැබලි 4. වීදුරු කැබලි

(9) ජාතික ගීය ගායනා කරන විට අප සිටගත යුත්තේ,
1. පහසුවෙන් ය. 2. සීරුවෙන් ය. 3. ඉවසීමෙන් ය. 4. සංවරව ය.

(10) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ ඉර සහ හඳ මඟින් මූර්තිමත් කෙරෙන්නේ,
1. සෞභාග්‍යයයි. 2. ස්වයංපෝෂිත බව
3. සදාකාලික පැවැත්මයි. 4. විනය ගරුක ජාතියයි.

(11) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ තුන්වන පියවර කුමක් ද?
1. මානසික ලිහිල් බව 2. අධිෂ්ඨානය 3. ප්‍රාර්ථනාව 4. උදානය

(12) මදුරුවන් නිසා පමණක් රෝග බෝවන කාණ්ඩය තෝරන්න.
1. මැලේරියාව, ඩෙංගු, බරවා 2. මැලේරියාව, පාචනය, මහාමාරිය
3. පාචනය, මහාමාරිය, ඩෙංගු 4. ඩෙංගු, මැලේරියාව, පාචනය

(13) කන මඟින් පමණක් තොරතුරු ලබා ගැනීම සඳහා අපට තොරතුරු ලබා දෙන මාධ්‍යයකි.
1. ගුවන්විදුලිය 2. පුවත්පත 3. පරිගණකය 4. රූපවාහිනිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(14) පහත සඳහන් ද්‍රව්‍ය ජලයට දැමූ විට ජලයේ පාවෙන දෙය කුමක් ද?
1. අයිස් කැටය    2. වීදුරු කැබැල්ල    3. ගල් කැටය    4. යකඩ ඇණය

(15) වැඩ පහසු කිරීමේ යන්ත්‍රයට අදාළ ව එය ක්‍රියා කරවන ආකාරය නිවැරදි ව දක්වන පිළිතුර,
1. කප්පිය - තල්ලු කිරීම.    2. ගිරය - ඇදීම.
3. විල්බැරෝව - තල්ලු කිරීම.    4. ඉස්කුරුප්පු නියන - ඇදීම.

(16) පාංශු ඛාදනය ඇති වීමට පහත කුමන ක්‍රියාව බලපායි ද?
1. කාණු කැපීම    2. ගස් කැපීම    3. කණකොළ වැවීම    4. ගල්වැටි බැඳීම

(17) සිදුරු කැමරාවක තිරය සෑදීමට යොදා ගන්නේ,
1. වර්ණ කඩදාසියකි.    2. සුදු කාඩ්බෝඩ් කැබැල්ලකි.
3. සුදු ටිෂූ කඩදාසියකි.    4. ලෝහ තහඩුවකි.

(18) විශාල ටයර් පරණ වූ විට, පරිසර හිතකාමී ලෙස ඒවාට කළ හැකි දෙයකි.
1. නිවෙස්වල වහල උඩ තැබීම.    2. එළිමහන් තැන්වල පිළිවෙළකට අසුරා තැබීම.
3. රාත්‍රී කාලයේ දී පුළුස්සා දැමීම.    4. ඉඩ අඩු තැන්වල බෝග වගා කිරීමට යොදා ගැනීම.

(19) වීදුරුවක ඇති සිසිල් ජලය මතට තේ කොළ ස්වල්පයක් දැමූ විට එම ජලය ඉක්මනින් තද දුඹුරු පාට විය. එම තේ කොළ වර්ගය ගැන කුමක් කිව හැකි ද?
1. ගුණාත්මක බවෙන් අඩු ය.    2. ගුණාත්මක බවෙන් වැඩි ය.
3. වැඩි කහට ගතියකින් යුක්ත ය.    4. නියමිත ප්‍රමිතියෙන් යුක්ත ය.

(20) දේදුන්නේ ඇති වර්ණ තුනකි.
1. රතු, කළු, නිල්    2. නිල්, කහ, කොළ    3. රතු, කොළ, සුදු    4. කහ, නිල්, දුඹුරු

(21) ඔලිම්පික් කොඩියේ, එකිනෙකට සම්බන්ධ වූ රවුම් ගණන වන්නේ,
1. දෙකකි.    2. තුනකි.    3. හතරකි.    4. පහකි.

(22) කතරගම පූජා නගරය අයත් වන්නේ,
1. දකුණු පළාතට ය.    2. සබරගමුව පළාතට ය.
3. නැගෙනහිර පළාතට ය.    4. ඌව පළාතට ය.

(23) මින්නේරිය වැව කරවන ලද්දේ,
1. මහසෙන් රජතුමා ය.    2. ධාතුසේන රජතුමා ය.
2. දේවානම් පියතිස්ස රජතුමා ය.    4. දුටුගැමුණු රජතුමා ය.

(24) " නිදහස් අධ්‍යාපනයේ පියා" යන විරුදාවලිය ලබන්නේ,
1. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මහතා    2. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
3. ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා    4. ආචාර්ය ටී.බී. ජයා මහතා

(25) සෑම ශ්‍රී ලංකා මුදල් නෝට්ටුවක ම අත්සන් කරන්නේ,
1. ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ය.    2. අගමැතිතුමා සහ මුදල් ඇමති ය.
3. මුදල් ඇමතිතුමා සහ මහ බැංකු අධිපතිතුමා ය.
4. මහ බැංකුවේ අධිපතිතුමා සහ භාණ්ඩාගාරයේ ලේකම්තුමා ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(26) අප සතුන්ට හිංසා නොකළ යුතු වන්නේ,
1. සතුන්ගෙන් ප්‍රයොජන ගැනීමට ඇති නිසා ය.
2. සතුන්ගෙන් අපට පාඩම් ඉගෙන ගැනීමට හැකි නිසා ය.
3. සතුන් ද අප මෙන් ජීවිතයට ආදරය කරන නිසා ය.
4. සතුන් ලස්සන නිසා ය.

(27) දියෙහි ගිලුණු අයකුට ප්‍රථමාධාර දීමේ දී පළමුවෙන් ම කළ යුතු වන්නේ කුමක් ද?
1. තෙත ඇඳුම් ඉවත් කිරීම. 2. පොරවනයක් මගින් ශරීරයේ උණුසුම ආරක්ෂා කිරීම.
3. හොඳින් හුස්ම ගන්නේ දැයි පරීක්ෂා කිරීම. 4. උණු පානයක් ලබා දීම.

(28) ජලය හා බැඳුණු සංස්කෘතික සිරිතක් නොවන්නේ පහත කුමක් ද?
1. සිංහල අලුත් අවුරුද්දට ළිඳ හා ගනුදෙනු කිරීම.
2. මංගල උත්සවවලදී දෙපා සෝදා මනාලයා පිළිගැනීම.
3. සමහර ආගමික භක්තිකයන් මිය ගිය විට මතක දේහය නැහැවීම.
4. කෙස් කපා ජල භාජනයකට දැමීම.

(29) අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ පහත සඳහන් කුමක් ද?
1. පදික වේදිකාවක ගමන් කිරීම.
2. මාර්ග සංඥා එළි පුවරුවක "කොළ පාට මිනිසා" දර්ශනය වූ විට පාර හරහා මාරු වීම.
3. පයින් ගමන් කරන විට තමන්ගේ දකුණු පැත්තෙන් ගමන් කිරීම.
4. දුම්රිය මාර්ගයේ ගමන් කිරීම.

(30) " විදුලියෙන් අනතුරු ඇති වේ." යන්න සඳහා භාවිත කරන රූපික ප්‍රකාශය කුමක් ද?



(1) (2) (3) (4)

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. 2013 - අගෝස්තු

(1) බීජ සහ අතු මගින් පැළවෙන ශාකයක් වන්නේ,
1. කරවිල 2. නිවිති ය. 3. තක්කාලි ය. 4. පතෝල ය.

(2) සුළඟ මගින් පැතිරී බෝවන ශාකයක් වන්නේ,
1. කජු ය. 2. තේක්ක ය. 3. පේර ය. 4. වරා ය.




(3) ශ්‍රී ලංකාවේ ඒකදේශිය සතකු වන්නේ,
1. කැහිබෙල්ලා ය. 2. ගිරවා ය. 3. කොහා ය. 4. කොකා ය.

(4) රාත්‍රී කාලයේ හැසිරෙන සතකු වන්නේ,
1. ගේකුරුල්ලා ය. 2. සැළළිහිණියා ය. 3. කපුටා ය. 4. ගොලුබෙල්ලා ය.

(5) හොඳින් මේරූ බීජයක හඳුනාගත හැකි, ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. ජල භාජනයකට දමන බීජ පතුලට බැසීම. 2. බීජයේ තැනින් තැන පුල්ලි සහිත වීම.
3. බීජයේ වර්ණය තද පැහැ නොගැනීම. 4. බීජය සැහැල්ලුවෙන් පොඩි කළ හැකි වීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(6) වඩු කර්මාන්තයේ දී යොදා ගන්නා උපකරණයකි.



(1)

(2)

(3)

(4)

(7) පහත සඳහන් රූපයේ දැක්වෙන ශාකය කුමක් ද?



1. ගොයම්
2. රතුළුනු
3. නීරමුල්ලිය
4. සැවැන්දරා

(8) මෙම මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,



1. දම්වැල් මැස්ම නමිනි.
2. කතිර මැස්ම නමිනි.
3. බ්ලැන්කට් මැස්ම නමිනි.
4. නැටි මැස්ම නමිනි.

(9) මහා මාර්ගයේ ඇති විදුලි සංඥා පුවරුවක රතු පාට එළිය දැල්වීමෙන් සංඥා කෙරෙන්නේ,
1. රථය ධාවනය කරන්නට යන්නයි.
2. රථය නවත්වන්න යන්නයි.
3. රථය ධාවනයට සූදානම්වන්න යන්නයි.
4. රථය දකුණට හරවන්න යන්නයි.

(10) මස් මාංශ පමණක් ආහාරයට ගන්නා සතෙකි.
1. බල්ලා
2. පූසා
3. හූනා
4. සිංහයා

(11) මඤ්ඤොක්කා අලවල බහුලව අඩංගු පෝෂ්‍ය පදාර්ථය වන්නේ,
1. විටමින් ය.
2. කාබෝහයිඩ්රේට් ය.
3. ලවණ ය.
4. ප්‍රෝටීන් ය.

(12) ඓතිහාසික වටිනාකමකින් යුත් පූජනීය නගරයකි.
1. අනුරාධපුරය
2. නුවරඑළිය
3. සීගිරිය
4. වවුනියාව

(13) ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි රටක් වන්නේ,
1. සෞදි අරාබිය
2. ජපානය
3. ඉන්දියාව
4. කැනඩාව

(14) ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පිහිටා ඇත්තේ,
1. කටුනායක ය.
2. මත්තල ය.
3. රත්මලානේ ය.
4. වීරවිල ය.

(15) ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය සහිත ව කිරි නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් පිහිටි ප්‍රදේශය වන්නේ,
1. වැලිසර
2. මහඉලුප්පල්ලම
3. හංවැල්ල
4. අඹේවෙල

(16) සූර්යයාට ළඟින් ම පිහිටි ග්‍රහ වස්තුව නම්,
1. පෘථිවිය
2. සිකුරු
3. බුධ
4. අඟහරු

(17) ශ්‍රී ලංකා සිතියමක අභය භූමි සලකුණු කර ඇත්තේ කිනම් වර්ණයකින් ද?
1. කළු
2. කොළ
3. රතු
4. නිල්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(18) පරිසර හිතකාමී කෘමිනාශකයක් සකස් කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය වූ බීජ වර්ගයකි.
1. ගස්ලබු ඇට 2. කොහොඹ ඇට 3. එඬරු ඇට 4. දඹල ඇට

(19) පාචනය රෝගය ඇති කරන්නේ,
1. ගෙමැස්සා ය. 2. මකුළුවා ය. 3. මදුරුවා ය. 4. කුරුමිණියා ය.

(20) දේවානම් පියතිස්ස රජතුමා විසින් තනවන ලද්දේ,
1. තිසා වැව 2. යෝධ වැව 3. කන්තලේ වැව 4. මහකනදරා වැව

(21) සුළු පිළිස්සීමක දී භාවිත කෙරෙන ඖෂධීය ශාකයකි.
1. රණවරා 2. පාවට්ටා 3. හාතාවාරිය 4. කෝමාරිකා

(22) කොලාජ් නිර්මාණයක් යනු
1. දිය සායම් යොදා ගනිමින් කරනු ලබන නිර්මාණයකි.
2. රේඛා මඟින් අඳිනු ලබන නිර්මාණයකි.
3. පැස්ටල් භාවිත කරමින් කරනු ලබන නිර්මාණයකි.
4. කඩදාසි කැබලි ඉරා කරනු ලබන නිර්මාණයකි.

(23) නිල් සහ රතු වර්ණ මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණය වන්නේ,
1. කළු ය. 2. සුදු ය. 3. දුඹුරු ය. 4. දම් ය.

(24) අකුණු ගසන විටක දී ආරක්ෂා වීමට වඩාත් ම සුදුසු ක්‍රමය වන්නේ,
1. ගසක් යටට වී සිටීම. 2. ජලාශයකට බැස සිටීම.
3. ගෙතුළ ඇඳක් මත සිටීම. 4. තැනිතලා බිමක ඇවිදීම ය.

(25) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ දක්නට හැකි සංකේතයක් වන්නේ,
1. බෝපත් ය. 2. හංසයා ය. 3. ඉර ය. 4. නාගයා ය.

(26) ජල පිල්ටරයක් සකස් කිරීම සඳහා යොදා ගනු ලබන උපකරණ කාණ්ඩය තෝරන්න.
1. ලොකු ප්ලාස්ටික් බෝතලයක්, පුළුන් ගුලියක්, බොරළු තට්ටුවක්, වැලි තට්ටුවක්
2. ලොකු ප්ලාස්ටික් බෝතලයක්, බොරළු තට්ටුවක්, ගඩොල් කැට කිහිපයක්, වැලි තට්ටුවක්
3. ලොකු ප්ලාස්ටික් බෝතලයක්, පුළුන් ගුලියක්, ගඩොල් කැට කිහිපයක්, මැටි ස්වල්පයක්
4. ලොකු ප්ලාස්ටික් බෝතලයක්, බොරළු තට්ටුවක්, ගඩොල් කැට කිහිපයක්, මැටි ස්වල්පයක්.

(27) කාන්දමක් ළංකළ විට ඇදී එන්නේ පහත සඳහන් කුමන ද්‍රව්‍යය ද?
1. පිත්තල 2. ඇලුමිනියම් 3. යකඩ 4. රිදී

(28) උසකින් වැටී ඉල ඇට බිඳීමකට ලක් වූ පුද්ගලයෙකු සඳහා වහා ම කළ යුතු ප්‍රථමාධාරය වන්නේ,
1. ශරීරයේ අනතුරට ලක් වූ ස්ථානය රෙදි පටියකින් බැඳීම.
2. ශරීරයේ අනතුරට ලක් වූ ස්ථානය පිරිසිදු ජලයෙන් සේදීම.
3. පුද්ගලයා නොසෙල්වෙන සේ සමතලා ස්ථානයක තැබීම.
4. උණු පානයක් ලබා දීම.

(29) ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගී මහා මාර්ගය කුමක් ද?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

1. උතුරු අධිවේගී මාර්ගය 2. දක්ෂිණ අධිවේගී මාර්ගය
3. කටුනායක අධිවේගී මාර්ගය 4. කොළඹ - නුවර අධිවේගී මාර්ගය

(30) සාමූහික ක්‍රීඩාවල නොතිබිය යුතු ගුණාංගය මින් කුමක් ද?
1. නායකත්වයට ගරු කිරීම. 2. තම කාර්යය වගකීමෙන් ඉටු කිරීම.
3. තමාට කැමති ලෙසින් කටයුතු කිරීම. 4. ජය පරාජය පිළිගැනීම.

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. <u>2012 - අගෝස්තු</u>

(1) පෙති හතරක් ඇති මලකට උදාහරණයක් වන්නේ,
1. සමන්පිච්ච ය. 2. ඉද්ද ය. 3. රත්මල් ය. 4. සේපාලිකා ය.

(2) ශ්‍රී ලංකාවේ ඒකදේශික ශාකයක් වන්නේ කුමක් ද?
1. කුප්පමේනියා 2. බිං කොහොඹ 3. හාතාවාරිය 4. ගොටුකොළ

(3) සතුන් මඟින් පමණක් ව්‍යාප්ත වන බීජ පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.
1. රබර්, ඇහැළ, කදුරු 2. කදුරු, කුඩළු, කජු
3. මදටිය, කුඩළු, තුත්තිරි 4. කජු, නාදරණ, තුත්තිරි

(4) ටින් මාළු මිල දී ගැනීමේ දී අඩු ම අවධානයක් යොමු විය යුතු කරුණ වන්නේ,
1. කල් ඉකුත්වීමේ දිනයයි. 2. භාණ්ඩය මිලට ගන්නා වෙළඳසැලයි.
3. භාණ්ඩයේ ගුණාත්මක බව 4. භාණ්ඩයේ වෙළඳ නාමයයි.

(5) තම නිවස ලෙස "තුඹස" සාදා ගන්නා සත්ත්වයා වන්නේ,
1. කුඹලා 2. නයා 3. වේයා 4. ගෝනුස්සා

(6) වගාවලට හානි කරන සත්ත්ව විශේෂයක් නොවන්නේ,
1. පැලමැක්කා ය. 2. කුඩිත්තා ය. 3. පුරුක් පණුවා ය. 4. බත් කුරා ය.

(7) තවාන් සාදා පැළ ලබා ගන්නා බෝගයකි.
1. බතල 2. කංකුං 3. මිරිස් 4. පතෝල

(8) "වියගහ" භාවිත කරන්නේ කුමන කර්මාන්තයේ ද?
1. මැටි කර්මාන්තයේ ය. 2. කෘෂිකර්මාන්තයේ ය.
3. රෙදිපිළි කර්මාන්තයේ ය. 4. ලෝහ කර්මාන්තයේ ය.

(9) වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ශ්‍රී ලංකාව ඉන්දියාවට දකුණින් පිහිටා ඇත.
2. ශ්‍රී ලංකාව අයත් වන්නේ අප්‍රිකා මහද්වීපයට ය.
3. ශ්‍රී ලංකාව කඳුලක හැඩය ගත් දූපතකි.
4. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇත.

(10) දකුණු පළාතට අයත් නගරයක් වන්නේ,
1. කළුතර 2. බලන්ගොඩ 3. අම්බලන්ගොඩ 4. මොනරාගල


(11) කොළඹ සිට බදුල්ල දක්වා වැටී ඇති දුම්රිය මාර්ගයේ හමුවන දුම්රිය නැවතුම්පොළකි.
1. වටවල 2. හබරණ 3. සීදූව 4. වවුනියාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(12) “සෙක්කුව” භාවිත කරන්නේ පහත සඳහන් කුමන කාර්යය සඳහා ද?
1. සී සෑම 2. වී (බැත) සුළං කිරීම 3. තෙල් සිඳීම. 4. පිටි කෙටීම.

(13) හිරමනය මුවහත් කිරීමට භාවිත කෙරෙන උපකරණය වන්නේ,
1. කියත ය. 2. පීර ය. 3. මිටිය ය. 4. නියන ය.


(14) රූපයෙන් දැක්වෙන උපකරණය කුමක් ද?



1. ඩැහි අඬුව 2. දඬු අඬුව
3. බුරුමය 4. යතු කැටය

(15) අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළදෙන රෝගයකි.
1. සෙම්ප්‍රතිශ්‍යාව 2. කක්කල් කැස්ස 3. කම්මුල්ගාය 4. සෙංගමාලය

(16) රූපයේ දැක්වෙන තරු රටාව හඳුන්වන නම කුමක් ද?



1. හත්දින්නත් තරු 2. දඬයක්කාරයා
3. මහ වලහා 4. කුඩා වලහා


(17) ධාතුසේන රජතුමා විසින් කරවන ලද වැවකි.
1. කලා වැව 2. අභය වැව 3. මින්නේරිය වැව 4. ගිරිතලේ වැව

(18) මෙම රූපයෙන් දැක්වෙන්නේ,



1. එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරණායක මහතා
2. ආචාර්ය සී. .ඩබ්ලිව්. .ඩබ්ලිව්.කන්නන්ගර මහතා
3. පොන්නම්බලම් රාමනාදන් මහතා
4. විලියම් ගොපල්ලව මහතා

(19) කහපාට පසුබිමෙහි කළු පාටින් ඇති මෙම රූපයෙන් දැක්වෙන මාර්ග සංඥාව කුමක් ද?



1. ගේට්ටුව සහිත දුම්රිය මාර්ගය.
2. ගේට්ටුව රහිත දුම්රිය මාර්ගය
3. ආරක්ෂා කර ඇති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි.
4. ආරක්ෂා කර නොමැති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි.


(20) රූපයේ දැක්වෙන සෙවණැල්ලෙන් නිරූපණය වන කුරුල්ලා,
1. කොකා ය.
2. කොරවක්කා ය.
3. කැරලා ය.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

4. කිරලා ය.

(21) පහත දැක්වෙන රූප අතරෙන් සියඹලා ශාක පත්‍ර සහිත රූපය තෝරන්න.



(22) ලේන්සුවක මලක් මැසීමේ දී මලෙහි නටුව මසා ගැනීමට වඩාත් ම සුදුසු මැහුම් ක්‍රමය වන්නේ,
1. නැටි මැස්ම 2. කතිර මැස්ම 3. පිස්මේන්තු මැස්ම 4. බ්ලැන්කට් මැස්ම

(23) සන්නිවේදනය සඳහා යොදා ගන්නා ජනප්‍රිය මුද්‍රිත මාධ්‍යය වන්නේ,
1. ගුවන් විදුලිය ය. 2. රූපවාහිනිය ය. 3. පුවත්පත 4. අන්තර්ජාලය

(24) සිරුරට අවශ්‍ය ප්‍රෝටීන් ලබා ගැනීමට සුදුසු ආහාරයක් වන්නේ,
1. අර්තාපල් ය. 2. පර්ප්පු ය. 3. කැරට් ය. 4. ගොටුකොළ ය.


(25) මෙම රූපික ප්‍රකාශනයෙන් කියවෙන්නේ කුමක් ද?



1. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
2. මාර්ග සංවර්ධන අධිකාරිය
3. ලංකා විදුලිබල මණ්ඩලය
4. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(26) මදුරුවන් මඟින් බෝවන රෝගයකි.
1. පාචනය 2. මැලේරියාව 3. කොළරාව 4. උණසන්නිපාතය

(27) මෙම ජල බඳුනේ ඇති A සහ B විය හැක්කේ පිළිවෙළින්,




1. ලී කැබැල්ලක් සහ කාසියකි.
2. ලී කැබැල්ලක් සහ ප්ලාස්ටික් කැබැල්ලකි.
3. යකඩ කැබැල්ලක් සහ ලී කැබැල්ලකි.
4.යකඩ කැබැල්ලක් සහ කාසියකි.

(28) ජලයේ දියවන ද්‍රව්‍යයක් වන්නේ,
1. පොල්තෙල් ය. 2. ඉටි ය. 3. භූමිතෙල් ය. 4. ලුණු ය.

(29) විද්‍යුත් චුම්භකයක් භාවිත වන උපකරණයක් වන්නේ,
1. විදුලි සීනුව 2. හුමාල බෝට්ටුව 3. විදුලි පන්දම 4. සිදුරු කැමරාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(30) කණ්ඩායම් ක්‍රීඩාවක් වන්නේ,
1. යගුලිය දැමීම. 2. එල්ලේ ගැසීම. 3. කවපෙත්ත විසි කිරීම. 4. හෙල්ල විසි කිරීම.

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. 2011 - අගෝස්තු

(1) ශ්‍රී ලංකාවේ ඒකදේශික ශාකයක් වන්නේ,
1. පොල් ය. 2. අඹ ය. 3. දෙළුම් ය. 4. හොර ය.

(2) ශාකයට මල්වලින් ඇති ප්‍රයෝජනය වන්නේ,
1. අලංකාරය ලබා දීමය. 2. තම වර්ගයා බෝ කිරීමට උපකාර කිරීම ය.
3. සුවඳ පැතිරවීම ය. 4. ශාකයේ ආයු කාලය වැඩි කිරීම ය.

(3) සුළඟින් පමණක් ව්‍යාප්තවන බීජ කාණ්ඩය පමණක් අඩංගු පිළිතුර වන්නේ,
1. නාගදරණ, වරා, මොනරකුඩුම්බිය 2. තොටිල, වරා, මොනරකුඩුම්බිය
3. තොටිල, කජු, හොර 4. නාගදරණ, කජු, හොර

(4) ක්ෂීරපායී සතෙකු වන්නේ,
1. හූනා ය. 2. කටුස්සා ය. 3. කඹරගොයා ය. 4. මුගටියා ය.

(5) පස සාරවත් කිරීමට උදව් වන සතෙකු වන්නේ,
1. පත්තෑයා ය. 2. ගැඩවිලා ය. 3. හැකරැල්ලා ය. 4. කූඩැල්ලා ය.

(6) බෝග වගාවේ දී ගොවියාට උපකාර වන සතෙකු වන්නේ,
1. මී මැස්සා ය. 2. කුඩිත්තායා ය. 3. ගොයම් මැස්සා ය. 4. බත් කූරා ය.

(7) රෝපණය කිරීමට සුදුසු බීජයක ලක්ෂණයක් වන්නේ,
1. නොමේරූ බීජයක් වීම ය. 2. පිටපොත්ත පැල්ලම් රහිතව දීප්තිමත් වීම ය.
3. තුවාල සහිත වීම ය. 4. බීජය අව පැහැවීම ය.

(8) විටමින් බහුල ආහාරයක් වන්නේ,
1. කඩල ය. 2. බතල ය. 3. සෝයා ය. 4. තක්කාලි ය.

(9) දියවැඩියා රෝගය පාලනය කිරීමට වඩාත් සුදුසු ආහාරය වන්නේ,
1. පාන් ය. 2. නූඩ්ලස් ය. 3. කව්පි ය. 4. මඤ්ඤොක්කා ය.


(10) මදුරුවන් මර්දනය සඳහා වඩාත් සුදුසු ආකාරය වන්නේ,
1. නිවසේ සිටින මදුරුවන් විනාශ කිරීම ය. 2. මදුරු බිත්තර විනාශ කිරීම ය.
3. මදුරු කීටයන් විනාශකිරීම ය. 4. අවට පරිසරයේ ජලය එක්රැස් වීමට ඉඩ නොදීම.

(11) බෝවන රෝගයක් ( ප්‍රදේශය පුරා) පැතිර යන අවස්ථාවක දී වහාම දැනුම් දිය යුත්තේ කාට ද?
1. පොලිස් ස්ථානාධිපතිවරයාට 2. රෝහලේ වෛද්‍ය නිළධාරියාට
3. විදුහල්පතිවරයාට 4. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට

(12) භූමි කම්පාවක දී තම ආරක්ෂාව සඳහා වහාම කළ යුත්තේ,
1. තමා සිටින ස්ථානයේ ම සිටීම ය. 2. ගසක් යටට යාම ය.
3. උස් ගොඩනැගිල්ලකට යාම ය. 4. විවෘත ස්ථානයකට යාම ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


(13) මෙම රූපයේ දැක්වෙන උපකරණය භාවිත කිරීමෙන්,



1. සුළං හමන දිශාව දැනගත හැකි ය.
2. සුළඟේ වේගය මැන ගත හැකි ය.
3. සුළි සුළං පිළිබඳ අනාවැකි පළ කළ හැකි ය.
4. කාලගුණය පිළිබඳ අනාවැකි පළ කළ හැකි ය.

(14) ශ්‍රී ලංකාවේ උස ම දිය ඇල්ල වන්නේ,
1. බඹර කන්ද ය. 2. දියලුම ය. 3. ලක්ෂපාන ය. 4. දුන්හිඳ ය.

(15) රූපයෙන් දැක්වෙන තරු රටාව හඳුන්වනු ලබන්නේ,



1. මහවලහා ලෙස ය. 2. හත්දින්නත් තරු ලෙස ය.
3. ගෝනුස්සා ලෙස ය. 4.දඩයක්කාරයා ලෙස ය.

(16) කොළඹ මෝදර ප්‍රදේශයෙන් මුහුදට වැටෙන්නේ,
1. මහවැලි ගඟ ය. 2. කැළණි ගඟ ය. 3. කළු ගඟ ය. 4. වලවේ ගඟ ය.

(17) අභය ( බසවක්කුළම ) කරවන ලද්දේ,
1. පණ්ඩුකාභය රජු විසිනි. 2. දේවානම්පියතිස්ස රජු විසිනි.
3. ධාතුසේන රජු විසිනි. 4. මහසෙන් රජු විසිනි.

(18) කහ පාට පසුබිමෙන් කළු පාටින් ඇති මෙම මාර්ග සංඥාවෙන් කියැවෙන්නේ,



1. පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි යන්නයි.
2. අනතුරු සහිත වංගුව ඉදිරියෙනි යන්නයි.
3. වැඩ කරන මිනිසුන් ඉදිරියෙනි යන්නයි.
4. ළමයි මාරුවන ස්ථානය ඉදිරියෙනි යන්නයි.

(19) රතු සහ කහ මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණය කුමක් ද?
1. දුඹුරු 2. රෝස 3. දම් 4. තැඹිලි

(20) "සකපෝරුව" යොදා ගනු ලබන්නේ,
1. වළං කර්මාන්තය සඳහා 2. කුඹුරු වැඩ සඳහා
3. පතල් කර්මාන්තය සඳහා 4. මැණික් ඔපමට්ටම් කිරීම සඳහා

(21) ලීයක කැටයමක් කපා ගැනීමට භාවිත කළ හැකි සුදුසු ම උපකරණය වන්නේ,
1. බුරුමය ය. 2. කතුරය ය. 3. නියන ය. 4. යතුකැටය ය.

(22) රූපයෙන් දැක්වෙන්නේ,

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com




1. මහාචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා ය.
2. ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතා
3. ආචාර්ය ටී. බී. ජයා මහතා
4. අනගාරික ධර්මපාලතුමා

(23) ඇඳුමක තැවරුණු තාර පැල්ලමක් ඉවත් කිරීමට සුදුසු ම ද්‍රව්‍යය වන්නේ,
1. පොල් තෙල් ය. 2. භූමිතෙල් ය. 3. දෙහි යුෂ ය. 4. සබන් ය.

(24) දිනපතා පුවත්පත්වල අවසන් පිටුවෙහි බොහෝ විට ඇතුළත් වන්නේ,
1. හදිසි අනතුරු පිළිබඳව ය. 2. ක්‍රීඩා තොරතුරු ය.
3. විදෙස් පුවත් ය. 4. රූපවාහිනී වැඩසටහන් විස්තර ය.


(25) මෙහි දැක්වෙන පාදය අයත් වන්නේ,




1. කුකුළාට ය. 2. තාරාවාට ය.
3. ගිරවාට ය. 4. උකුස්සාට ය.

(26) චන්ද්‍රයා වඩාත් ම විශාලව අහසේ දැකිය හැකි වන්නේ,
1. පසළොස්වක දිනට පෙර දිනයේ ය. 2. පසළොස්වක දින ය.
3. පසළොස්වක දිනට පසු දිනයේ ය. 4. අටවක දින ය.

(27) විදුලි පන්දමක් වඩාත් දීප්තිමත් ව දැල්වීම සඳහා වියළි කෝෂ නිවැරදි ව සම්බන්ධ කළ යුතු ආකාරය දැක්වෙන්නේ කුමන රූපයේ ද?





(28) රූපයෙන් දැක්වෙන මැහුම් ක්‍රමය වඩාත් සුදුසු වන්නේ,



1. ඉරුණු ඇඳුමක් මැසීමට 2. බොත්තම් කාසයක් මැසීමට
3. ඇඳුමක වාටියක් මැසීමට 4. කමිසයක කොළරයක් මැසීමට

(29) මෙම රූපික ප්‍රකාශනයෙන් අදහස් වන්නේ කුමක් ද?



1. බිඳෙන සුළු ය. 2. පරෙස්සමෙන් අල්ලන්න.
3. මේ පැත්ත උඩට 4. එක මත එක ගබඩා නොකළ යුතු ය.

(30) තරඟ දිවීමක දී ආරම්භක ඉරියව්ව දැක්වෙන රූපය තෝරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(1)


(2)


(3)


(4)


❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. 2010 - අගෝස්තු

(1) අවුරුද්ද පුරා ම මල් පිපෙන ශාකයකි.
1. ඇහැළ 2. එරබදු 3. අරලිය 4. රණවරා


(2) ජලජ ශාකයකි.
1. මොනරකුඩුම්බිය 2. ගිරිතිල්ල 3. මීවන 4. හයිඩ්‍රිල්ලා

(3) අඹ, ගම්මාලු, පොල් යන බීජ වර්ග ව්‍යාප්ත වන්නේ පිළිවෙළින්,
1. සුළඟ, ජලය හා සතුන් මඟින් 2. සුළඟ, සතුන් හා ජලය මඟින්
3. ජලය, සුළඟ හා සතුන් මඟින් 4. සතුන්, සුළඟ හා ජලය මඟින්

(4) ශාක පත්‍ර උපයෝගී කරගෙන තම නිවහන සාදා ගන්නේ,
1. කොකා ය. 2. කපුටා ය. 3. දිමියා ය. 4. ලේනා ය.

(5) ශ්‍රී ලංකාවේ ඒකදේශික සත්ත්ව විශේෂයක් වන්නේ,
1. කැහිබෙල්ලා ය. 2. මොනරා ය. 3. ගිරවා ය. 4. කපුටා ය.

(6) රූපයේ දැක්වෙන කුරුල්ලාගේ නම කුමක් ද?



1. පිළිහුඩුවා 2. කොට්ටෝරුවා
3. කොරවක්කා 4. ගිරවා

(7) බතලවල ඇති බහුලව ම ඇති පෝෂකය වන්නේ,
1. ප්‍රෝටීන් ය. 2. පිෂ්ටය ය. 3. විටමින් ය. 4. ලිපිඩ ය.

(8) වැලි යට තැබීමෙන් කල් තබා ගත හැකි ආහාර වර්ග සඳහා නිදසුනකි.
1. දෙහි, මාළු 2. අඹ, අල 3. එළු, දෙල් 4. දෙහි, කොස් ඇට

(9) අතු කැබලි සිටුවීමෙන් පැළ ලබා ගත හැකි බෝග වර්ගය කුමක් ද?
1. මිරිස් 2. මෑ 3. කංකුං 4. අර්තාපල්

(10) ගෙවතු වගාවේ දී භාවිත කරන උපකරණ පමණක් ඇති පිළිතුර තෝරන්න.
1. උදැල්ල, මුල්ලුව, ලඹය 2. මයිනහම, නඟුල, රේක්කය
3. යතු කැටය, උදැල්ල, මිටිය 4. උදැල්ල, මුල්ලුව, රේක්කය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(11) මෙම රූපික ප්‍රකාශයෙන් කියවෙන්නේ,



1. "වටරවුමක්" යන්නයි. 2. ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ය.

3. "දකුණට හැරවිය යුතුය" යන්නයි.

4. පරෙස්සමෙන් පරිහරණය කරන්න යන්නයි.

(12) මහාමාරිය රෝගය බෝවෙන්නේ,
1. මදුරුවාගෙනි. 2. මීයාගෙනි. 3. මැස්සාගෙනි. 4. කුකුළාගෙනි.

(13) ඩෙංගු රෝගය සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ඕනෑ ම මදුරුවෙකුගෙන් ඩෙංගු රෝගය බෝවිය හැකි ය.
2. ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වළක්වා ගත හැකි ය.
3. ඩෙංගු රෝගය සුව කළ හැකි ය.
4. ඩෙංගු රෝගය හේතු කොටගෙන මරණයට ද පත් විය හැකි ය.

(14) අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳිය හැකි රෝගයකි.
1. මැලේරියාව 2. ක්ෂය රෝගය 3. මී උණ 4. සෙංගමාලය

(15) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ජලය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ජලයට නිශ්චිත හැඩයක් නොමැත.
2. රත් කරන විට, ජලය වාෂ්ප බවට පත් වේ.
3. උෂ්ණත්වය වැඩි වන විට, සීනි ජලයේ දිය වීම අපහසු ය.
4. කැලතීම නිසා, සීනි දිය වීම පහසු වේ.

(16) සිතියමක දුම්රිය මාර්ග දැක්වෙන සම්මත වර්ණය කුමක් ද?
1. කහ ය. 2. නිල් ය. 3. කළු ය. 4. දුඹුරු ය.

(17) රූපයේ දැක්වෙන තරු රටාව හඳුන්වන නම කුමක් ද?



| | |
|---|---|
| 1. හත්දින්නත් තරු | 2. මහවලහා |
| 3. දඬයක්කාරයා | 4. ගෝනුස්සා |

(18) නැති වූ හැඳුනුම්පත පිළිබඳ වාර්තා කිරීම, යතුරු පැදිය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම හා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ලබා ගැනීම යන කාර්යයන් සඳහා යා යුතු ස්ථාන පිළිවෙළින්,
1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලීසිය, දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලයයි.
2. පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලයයි.
3. දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලයයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලීසිය,
4. පොලීසිය, දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලයයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

(19) ශ්‍රී ලංකා ජාතික කොඩියේ දමිළ ජනවර්ගය නියෝජනය වන්නේ,
1. තැඹිලි පාට තීරුවෙනි. 2. රතු පාට තීරුවෙනි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

3. කොළ පාට තීරුවෙනි. 4. කහ පාට තීරුවෙනි.

(20) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ ඇති පුන්කලසෙන් අදහස් කෙරෙන්නේ,
1. සෞභාග්‍යයයි. 2. ස්වයංපෝෂිත බවයි. 3. විනය ගරුක බවයි. 4. සදාකාලික බවයි

(21) කලාවැව ඉදි කරවන ලද්දේ,
1. පණ්ඩුකාභය රජු ය. 2. ධාතුසේන රජු ය.
3. මහසෙන් රජු ය. 4. මහා පරාක්‍රමබාහු රජු ය.


(22) රූපයෙහි දැක්වෙන්නේ,



1. යාපහුව බලකොටුවයි. 2. ශ්‍රීපාදස්ථානය
3. සීගිරිය 4. දළදා මාළිගාව

(23) කිණිහිර භාවිත කරනු ලබන්නේ,
1. වඩු මඩුවේ ය. 2. කම්මලේ ය. 3. කුඹුරේ ය. 4. පතලේ ය.

(24) යකඩ ඇණය වෙත අල්පෙනෙති වැඩියෙන් ම ඇදී එන්නේ පහත සඳහන් කුමන ඇටවුමේ ද?




(1) (2) (3) (4)

(25) පහත දැක්වෙන උපකරණ අතුරෙන් බීම බෝතල් විවෘත කිරීමට යොදා ගන්නේ කුමක් ද?



(1) (2) (3) (4)

(26) බල්බය දැල්වීම සඳහා A හා B ඇණ දෙක සම්බන්ධ කිරීමට යොදා ගත හැක්කේ,




1. වාර්නිස් කොළයකි. 2. රීයම් කොළයකි.
3. ඩිමයි කොළයකි. 4. සව් කොළයකි.

(27) රූපයේ දැක්වෙන පරිදි දැල්වෙන ඉටි පන්දම් හතරක් එකිනෙකට වෙනස් උසින් යුත් වීදුරු භාජන හතරකින් එක්වරම වැසූ විට,


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com




- පළමු ව නිවී යන්නේ කුමන ඉටි පන්දම ද?
  1. A　　2. B　　3. C　　4. D

(28) සර්පයෙක් දෂ්ට කළ වහාම ලබා දිය යුතු ප්‍රථමාධාරයක් වන්නේ කුමක් ද?
1. පිරිසිදු වාතාශ්‍රය ලැබෙන්නට සැලැස්සීම.
2. තද ඇඳුම් බුරුල් කිරීම.
3. දෂ්ට කළ ස්ථානය සබන් ගා ඇල් වතුරෙන් සේදීම.
4. රෝගියාගේ දෙපා අඩියක් පමණ එසවෙන සේ දිගා කිරීම.

(29) රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය කුමක් ද?



1. බ්ලැන්කට් මැස්ම　　2. මාළු කටු මැස්ම
3. නැටි මැස්ම　　4. දම්වැල් මැස්ම

(30) එල්ලේ ක්‍රීඩාවේ දී එක් කණ්ඩායමකට උපරිම වශයෙන් සිටිය යුතු ක්‍රීඩකයින් ගණන කීය ද?
1. 10　　2. 12　　3. 14　　4. 16

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.　　<u>2009 - අගෝස්තු</u>

(1) පහත දැක්වෙන මල් වර්ග අතුරින් සවස පිපෙන මල් වර්ගය වන්නේ,
1. වතු සුද්ද ය.　　2. කුමුදු ය.　　3. සේපාලිකා ය.　　4. හෙන්දිරික්කා ය.

(2) රාත්‍රී කාලයේ දී සැරිසරණ පක්ෂියෙකු නොවන්නේ,
1. බස්සා ය.　　2. උලමා ය.　　3. කෑදැත්තා ය.　　4. බකමූණා ය.

(3) පලතුරු වගාවට බෙහෙවින් හානි කරන සතෙකු වන්නේ,
1. කැරපොත්තා ය.　　2. පිටිමකුණා ය.　　3. දළඹුවා ය.　　4. මකුළුවා ය.

(4) ඇතින් ඇති ගොදුරු දැක අල්ලා ගැනීමට වඩාත් ම හැකියාව ඇති කුරුල්ලෙකු වන්නේ,
1. කොකා ය.　　2. උකුස්සා ය.　　3. රාජලියා ය.　　4. වැහිළිහිණියා ය.

(5) ගෙවත්තේ බෝග වගාවට හානි කරන ලබන කෘමීන්ගේ පැමිණීම වළක්වා ගැනීමට වගා කරන ශාකයක් වන්නේ,
1. මඳුරුතලා ය.　　2. ගඳපාන ය.　　3. පැඟිරි ය.　　4. දහස්පෙතියා ය.

(6) බත් පිසීම සඳහා සහල් ගැරීමට වඩාත් ම උචිත භාජනය වන්නේ,
1. මැටිකෝප්පයයි.　　2. වළඳයි　　3. නැබිලියයි.　　4. කොරහයි.

(7) බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම යොදා ගැනීමේ ඇති වාසියක් නොවන්නේ,
1. පහසුවෙන් සාත්තු සප්පායම් කළ හැකි වීමයි.
2. අව් වැසි ආදියෙන් ආරක්ෂා කර ගත හැකි වීමයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

3. අවශ්‍ය විට එහා මෙහා කළ හැකි වීමයි.
4. ඉඩ කඩ ඇති තැන්වල පමණක් වගා කළ හැකිවීමයි.

(8) ශරීර වර්ධනය සඳහා වැඩි බලපෑමක් ඇති කරන ලබන ආහාර යුගලයක් වන්නේ,
1. එළකිරි සහ දොඩම් යුෂ ය. 2. බිත්තර සහ කුරක්කන් රෝටි ය.
3. මුං ඇට සහ සෝයා බෝංචි ය. 4. සෝයා බෝංචි සහ නිවිති ය.

(9) කැඳ සෑදීම සඳහා ගන්නා කොළ වර්ගයක් නොවන්නේ,
1. ගොටුකොළ ය. 2. යකිනාරං කොළ ය. 3. කෝප්පකොළ ය. 4. එළබටු කොළ ය.

(10) ප්ලාස්ටික් කෝප්පයක අසුරන ලද යෝගට් කෑමට ප්‍රථම විශේෂයෙන් සැලකිලිමත් විය යුතේත්,
1. අසුරන ලද දිනය ගැනයි. 2. කල් ඉකුත් වන දිනය ගැනයි.
3. අඩංගු දේ ගැනයි. 4. ප්‍රමිති ලාංඡනය ගැනයි.

(11) රාජ්‍ය ආයතනවලින් සැපයෙන සේවා හා සම්බන්ධ තොරතුරු දැන ගැනීම සඳහා ඇමතිය යුතු දුරකතන අංකය වන්නේ,
1. 118 වේ. 2. 119 වේ. 3. 1231 වේ. 4. 1919 වේ.

(12) ලියාපදිංචි තැපෑලෙන් මෙරට තුළ ලිපියක් යැවීම සඳහා කොපමණ වටිනාකමකින් යුත් මුද්දර අඩු ම වශයෙන් අවශ්‍ය වේ ද?
1. රු. 20.00 2. රු. 25. 00 3. රු. 30.00 4. රු. 35.00

(13) කුඹුරේ ලියද්දකින් තවත් ලියද්දකට වතුර බැස යාමට නියරේ කපා ඇති මාර්ගය වන්නේ,
1. සොරොව්ව ය. 2. වක්කඩ ය. 3. බිසෝකොටුව ය. 4. ඇල ය.

(14) ශ්‍රී ලංකාවේ උස් බිම් හා පහත් බිම් දැක්වෙන සිතියමක උස්බිම් වර්ණ කර තිබෙන්නේ,
1. නිල් පාටිනි. 2. දුඹුරු පාටිනි. 3. රතු පාටිනි. 4. කොළ පාටිනි.

(15) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා දෙකක් එකම පළාතකින් මුහුදට ගලා බසී. ඒ ගංගා දෙක නම්,
1. මහවැලි සහ වලවේ වේ. 2. වලවේ සහ කැලණි වේ.
3. කැලණි සහ කළු වේ. 4. ගිං සහ කළු වේ.

(16) මෙම සංකේතයෙන් ප්‍රකාශ වන්නේ,



1. ගැබිණි මව්වරුන් සඳහා බව 2. ආබාධිත අය සඳහා බව
3. වයස්ගත වූවන් සඳහා බව 4. ළමයින් සඳහා බව

(17) ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ සදාකාලික පැවැත්ම නිරූපණය වන්නේ,
1. ධර්ම චක්‍රය මගිනි. 2. පුන්කලස මගිනි.
3. පලාපෙති මගිනි. 4. ඉර සහ හඳ මගිනි.

(18) ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම ඉදි වූ වැව වන්නේ,
1. තිසා වැව ය. 2. ගිරිතලේ වැව ය. 3. බසවක්කුලම ය. 4. වවුනිකුලම ය.

(19) ශ්‍රී ලංකාවට උදාර සේවයක් සිදු කළ, මෙම රූපයේ දැක්වෙන ශ්‍රේෂ්ඨ පුද්ගලයා කවු ද?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



1.ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතා

2. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා

3. ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහතා

4. ආචාර්ය ටී. බී. ජයා මහතා


(20) අකුණු සැර වැදීමට වඩාත් ම ඉඩ ඇත්තේ,
1. වාහනයක ගමන් කරන විට ය.
2. එළිමහන් පිට්ටනියක රැඳී සිටින විට ය.
3. ලෑලි අතිරූ බිමක සිටගෙන සිටින විට ය.
4. තාර පාරක ගමන් කරන විට ය.

(21) බල්ලෙකු සපා කෑ අවස්ථාවක දී ප්‍රථමයෙන් ම කළ යුතු වන්නේ,
1. සපා කෑ ස්ථානය රෙදි පටියකින් ගැට ගැසීම ය.
2. සපා කෑ ස්ථානය සබන් ගා පිරිසිදු ජලයෙන් සේදීම ය.
3. සපා කෑ ස්ථානය මත බෙහෙත් ගැල්වීම ය.
4. රෝගියා වෛද්‍යවරයෙකු වෙත ගෙන යාම ය.


(22) ලුණු කුඩු ඉක්මනින් දිය වන්නේ,

1. උණු ජලයේ ය. 2. ඇල් ජලයේ ය. 3. ශීත කළ ජලයේ ය. 4. උණු කළ නිවා ගත් ජලයේ ය.

(23) සූර්යය නමස්කාර අභ්‍යාසයේ හතරවන අවස්ථාව දැක්වෙන රූපය කුමක් ද?


(1) (2) (3) (4)

(24) මෙම රූපයේ දැක්වෙන පරිදි ගෙමිදුලේ කෙටු ඇඳ කරනු ලබන ක්‍රීඩාව වන්නේ,



1. චක්ගුඩු ය.
2. බට්ටා පැනීම ය.
3. ලුණු පැනීම ය.
4. ගුඩු පැනීම ය.

(25) බටනළාවක සිදුරු නිවැරදි ව දැක්වෙන රූපය කුමක් ද?


(1) (2) (3) (4)

(26) කාන්දම් කැබැල්ලකට ඇදී එන ද්‍රව්‍ය යුගලයක් වන්නේ,
1. පිත්තල සහ යකඩ ය.
2. ඇලුමිනියම් සහ පිත්තල ය.


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

3. යකඩ සහ වානේ ය. 4. යකඩ සහ ඇලුමිනියම් ය.

(27) පිත්තල මේස හැන්දකට ජලය ස්වල්පයක් දමා ඉටි පන්දම් දැල්ලකට ඇල්ලීමෙන්,
1. ජලයේ වර්ණය වෙනස් වේ. 2. ජලය වාෂ්ප වේ.
3. ජලයේ ස්වරූපය වෙනස් නොවේ. 4. ජලය සහිත හැන්ද රත් නොවේ.


(28) ඇවිලෙමින් පවතින ගිනි අඟුරු සහිත ගින්නකට වියළි ලුණු කැට ස්වල්පයක් දැමූ විට සිදු වන්නේ,
1. ලුණු කැට දියවීමයි. 2. ලුණු කැට ශබ්ද නගා පිපිරීමයි.
3. ලුණු කැට ඇවිළී යාමයි. 4. ගිනි දැල් නිවී යාමයි.

(29) වියළි කෝෂ ( C ) දෙකක්, බල්බයක් (B) සහ ස්විචයක් (S ) වයර් කැබලි මගින් පහත සඳහන් ආකාරවලට සම්බන්ධ කර ඇත. ස්විචය දැමූ විට බල්බය දැල්වන රූපය කුමක් ද?




❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. <u>2008 - අගෝස්තු</u>

(1) මෙම රූපයෙන් පෙන්නුම් කෙරෙන රූපය වන්නේ,



1. ඉරමුසු 2. වැල් පෙනෙල
3. ඉරිවේරිය 4. මුකුණුවැන්න.

(2) අනතුරක් සිදුවන බව දැනුණු වහා ම තම ශරීරය රෝදයක් සේ හකුළුවා ගන්නා සතකු වන්නේ
1. බිංකුණ්ඩා 2. හැකරැල්ලා 3. කුඩැල්ලා 4. දළඹුවා

(3) වැස්සක් ළඟ එන බව හඳුනාගත හැකි සත්ත්ව හැසිරීමක් වන්නේ,
1. බළලුන් කෑ ගැසීම. 2. නරියන් හූ කීම. 3. බල්ලන් බිරීම. 4. මෙරුවන් ඉඟිලීම.

(4) රාත්‍රී කාලයේ දී සැරිසරන පක්ෂියෙකු වන්නේ,
1. උලමා ය. 2. කැරලා ය. 3. පිළිහුඩුවා ය. 4. කොරවක්කා ය.

(5) පහත සඳහන් කවර අවස්ථාවක දී නිවසේ වෙසෙන බල්ලා උඩු බුරලන්නේ ද?
1. තම සීමාවට වෙනත් බල්ලෙකු පැමිණි විට 2. අමුත්තකු නිවස දෙසට පැමිණෙන විට
3. බල්ලාට දුකක් හෝ පාළුවක් දැනෙන විට 4. කිසිවකු විසින් බල්ලාට හිරිහරයක් කළ විට

(6) "කළු පොල් මාළුව" පිළියෙල කර ගැනීමේ දී යොදා ගනු ලබන බීජ වර්ගයක් වන්නේ,
1. කළු කවුපි ය. 2. කොස් ඇට ය. 3. රටදෙල් ය. 4. බිංපොල් ය.

(7) පියනකින් නොවසා පිසිය යුතු ආහාර වර්ගයක් වන්නේ,
1. බතල ය. 2. දෙල් ය. 3. මඤ්ඤොක්කා ය. 4. කොස් ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(8) ඇලුමිනියම් භාජනයක පිසිනු ලබන ආහාරයකට මිශ්‍ර කිරීමට නුසුදුසු ද්‍රව්‍යය කුමක් ද?
1. කුරුඳු ය.    2. සුදු ලූනු ය.    3. ගොරක ය.    4. ඉඟුරු ය.

(9) අත්වල කොහොල්ලෑ ගැවුණු විට ඒවා පහසුවෙන් ඉවත් කළ හැකි සුදුසු ම දේ වන්නේ,
1. සබන් ය.    2. ඇල්ජලය ය.    3. උණුජලය ය.    4. භූමිතෙල් ය.

(10) නිල් සහ රතු සායම් මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණ කුමක් ද?
1. කළු    2. දම්    3. කහ    4. කොළ

(11) දැල්පන්දු (නෙට්බෝල්) කණ්ඩායමක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව වන්නේ,
1. 6කි.    2. 7කි.    3. 8කි.    4. 9කි.

(12) ධාවකයකු දිවීම අවසන් වූ වහාම කළ යුතු වන්නේ,
1. කෙටි වේලාවක් බිම දිගා වී සිටීම ය.    2. සිසිල් කළ පානයක් ගැනීම ය.
3. සිරුර ජලයෙන් තෙමා ගැනීම ය.    4. සරල ව්‍යායාමයක යෙදීමය.

(13) පදිංචිය සනාථ කිරීම සඳහා සහතිකයක් ලබා ගැනීමට යා යුත්තේ,
1. ප්‍රාදේශීය ලේකම් වෙත ය.    2. ග්‍රාම නිළධාරී වෙත ය.
3. පොලිස් ස්ථානාධිපති වෙත ය.    4. සමෘද්ධි නියාමක වෙත ය.

(14) සැක කටයුතු පාර්සලයක් දුටු විගස ආරක්ෂාව සඳහා දැන්විය යුතු දුරකතන අංකය වන්නේ,
1. 119    2. 147    3. 456    4. 1919

(15) මහසෙන් රජු විසින් කරවන ලද වැවක් වන්නේ,
1. තිසා වැව    2. කලා වැව    3. මින්නේරිය වැව    4. පරාක්‍රම සමුද්‍රය

(16) නියමිත වර්ණ නොයොදා ඉදිරිපත් කර ඇති පහත ලාංඡන අතුරෙන් ශ්‍රී ලංකා තැපැල් සේවාවේ ලාංඡනය තෝරන්න.

1

2.

3.

4.



(17) "ඔන්න මලේ ඔය නාමල නෙළා    වරෙන්"
අත්ත බිදෙයි පය බුරුලෙන් තබා    වරෙන්

ඉහත කවි පද දෙක අයත් වන්නේ, කිනම් ජන කවි වර්ගයට ද?
1. පතල් කවි    2. පාරු කවි    3. ගොයම් කවි    4. පැල් කවි

(18) චන්ද්‍රග්‍රහණයක් ආරම්භ වන විට,
1. චන්ද්‍රයා ක්‍රමයෙන් අඳුරු වෙයි.    2. චන්ද්‍රයා එකවර අඳුරු වෙයි.
3. චන්ද්‍රයාගේ දීප්තිය එකවර වැඩි වෙයි.    4. චන්ද්‍රයාගේ දීප්තිය ක්‍රමයෙන් වැඩි වෙයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

❖ දී ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




19. පොළොන්නරුව නගරය දැක්වෙන්නේ කුමන ඉංග්‍රීසි අකුරෙන් ද?

1. A 2. B 3. C 4. D

20. කළු ගඟ දැක්වෙන්නේ කුමන ඉංග්‍රීසි අකුරෙන් ද?

1. W 2. X 3. Y 4. z

(21) ගමනාගමනය සඳහා වැඩි වැඩියෙන් පා පැදි භාවිතය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

1. පරිසර දූෂණය අඩු කරගත හැකි ය. 2. ගමනාගමන වියදම අඩු කරගත හැකි ය.
3. අනතුරු අඩු කරගත හැකි ය. 4. ලෙඩ රෝග අඩු කරගත හැකි ය.

(22) රූප සටහනේ දැක්වෙන පොලිස් නිලධාරියා ලබා දෙන සංඥාවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?



1. පිටුපසින් එන වාහන පමණක් නතර වෙනු.
2. ඉදිරියෙන් එන වාහන පමණක් නතර වෙනු.
3. ඉදිරියෙන් හා පිටුපසින් එන සියලුම වාහන නතර වෙනු.
4. ඉදිරියෙන් හා පිටුපසින් එන සියලුම වාහන නොනවත්වා යනු.

(23) මළ බැඳුණු ඇණයක් පාදයක ඇනුණු අයෙකුට නොපමාව බීමට දිය යුතු සුදුසු ඖෂධීය පානය වන්නේ,


1. කොත්තමල්ලි 2. වෙනිවැල්ගැට 3. බෙලිමල් 4. රණවරා

(24) ජලය පිර වූ බෝතලයක, කට තේ පෙරණයකින් වසා රූප සටහනේ දැක්වෙන පරිදි පහළට හරවා අල්ලා ගත් විට බෝතලයේ ජලය,



1. බිංදු වශයෙන් පහළට වැටෙයි.
2. තනි දිය පහරක් සේ පහළට වැටෙයි.
3. සිහින් දිය පහරවල් සේ විසිරෙයි.
4. පහළට නොවැටී පවතියි.

(25) ජලය පිරි වීදුරුවක පතුලේ ඇති වීදුරු බෝලයක් රූපයේ පෙන්වා ඇත. ජල මට්ටමට ඉහළින් ඇස් තබා බැලූ විට බෝලය පෙනෙන්නේ,




1. නියමිත ප්‍රමාණයට සමානව නියමිත ගැඹුරේ පිහිටා ඇති ලෙස ය.
2. නියමිත ප්‍රමාණයට සමානව අඩු ගැඹුරක පිහිටා ඇති ලෙස ය.
3. නියමිත ප්‍රමාණයට වඩා විශාලව නියමිත ගැඹුරේ පිහිටා ඇති ලෙස ය.
4. නියමිත ප්‍රමාණයට වඩා විශාලව අඩු ගැඹුරක පිහිටා ඇති ලෙස ය.

(26) කඩදාසියක දවටා ඇති A නම් ඝන වස්තුවක් සහ කොයිල් කම්බියක් ඔතන ලද B නම් යකඩ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


ඇණයක් 1 වන රූපයෙන් දැක්වේ. කම්බි දෙකෙළවර වියළි කොෂයකට සම්බන්ධ කළ විට A වස්තුව පිහිටන ආකාරය 2 වන රූපයෙන් දැක්වේ. A නම් ඝන වස්තුව විය හැක්කේ,

1. පිත්තල කැබැල්ලකි.
2. යකඩ කැබැල්ලකි.
3. ඇලුමිනියම් කැබැල්ලකි.
4. කාන්දම් කැබැල්ලකි.





1 රූපය 2 රූපය

(27) බල්බයක් වියළි කෝෂයකට ස්පර්ශ වන සේ තබා, තනි කම්බි කැබැල්ලක් යොදා ගෙන දැල්විය හැකි එක් ආකාරයක් 1 රූපයේ පෙන්වා ඇත. එම කම්බියම යොදා ගෙන බල්බය දැල්විය හැකි ආකාරයක් 2 රූපයේ කොටුව තුළ අඳින්න.



1 රූපය 2 රූපය

❖ ගොඩනැඟිලි ඉදිකිරීමේ දී යොදා ගන්නා උපකරණ කිහිපයක් පහත සඳහන් වේ.



1. 2. 3. 4. 5.

❖ පහත එක් එක් කාර්යය සඳහා යොදා ගන්නා උපකරණය දැක්වෙන අංකය අදාළ හිස්තැනෙහි ලියන්න.

(28) බැමි ඉදිකිරීමේ දී සිරස් බව පවත්වා ගැනීමට ..............................

(29) බාල්කවල තිරස් බව පවත්වා ගැනීමට ..............................

(30) බදාම හා කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමට ..............................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පිළිතුරු පත්‍රය 2019

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 2 | (2) 1 | (3) 1 | (4) 4 | (5) 2 | (6) 1 | (7) 4 | (8) 2 |
| (9) 3 | (10) 2 | (11) 4 | (12) 3 | (13) 3 | (14) 4 | (15) 1 | (16) 2 |
| (17) 4 | (18) 3 | (19) 4 | (20) 2 | (21) 3 | (22) 2 | (23) 2 | (24) 1 |
| (25) 3 | (26) 3 | (27) 2 | (28) 2 | (29) 3 | (30) 3 | | |

පිළිතුරු පත්‍රය 2018

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 1 | (2) 2 | (3) 3 | (4) 3 | (5) 2 | (6) 4 | (7) 3 | (8) 3 |
| (9) 1 | (10) 2 | (11) 1 | (12) 3 | (13) 4 | (14) 3 | (15) 2 | (16) 1 |
| (17) 1 | (18) 4 | (19) 3 | (20) 4 | (21) 3 | (22) 4 | (23) 2 | (24) 2 |
| (25) 3 | (26) 4 | (27) 4 | (28) 1 | (29) 3 | (30) 3 | | |

පිළිතුරු පත්‍රය 2017

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 1 | (2) 4 | (3) 2 | (4) 3 | (5) 1 | (6) 4 | (7) 2 | (8) 3 |
| (9) 1 | (10) 4 | (11) 3 | (12) 1 | (13) 2 | (14) 3 | (15) 3 | (16) 4 |
| (17) 1 | (18) 4 | (19) 2 | (20) 3 | (21) 4 | (22) 2 | (23) 1 | (24) 2 |
| (25) 3 | (26) 2 | (27) 4 | (28) 1 | (29) 3 | (30) 2 | | |

පිළිතුරු පත්‍රය 2016

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 2 | (2) 1 | (3) 2 | (4) 4 | (5) 2 | (6) 3 | (7) 2 | (8) 1 |
| (9) 1 | (10) 3 | (11) 1 | (12) 2 | (13) 2 | (14) 1 | (15) 3 | (16) 3 |
| (17) 4 | (18) 3 | (19) 3 | (20) 1 | (21) 2 | (22) 4 | (23) 3 | (24) 3 |
| (25) 3 | (26) 4 | (27) 3 | (28) 1 | (29) 4 | (30) 2 | | |

පිළිතුරු පත්‍රය 2015

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 1 | (2) 2 | (3) 1 | (4) 4 | (5) 3 | (6) 4 | (7) 4 | (8) 2 |
| (9) 2 | (10) 3 | (11) 4 | (12) 1 | (13) 1 | (14) 3 | (15) 4 | (16) 2 |
| (17) 4 | (18) 2 | (19) 1 | (20) 3 | (21) 3 | (22) 1 | (23) 3 | (24) 4 |
| (25) 3 | (26) 2 | (27) 2 | (28) 3 | (29) 2 | (30) 4 | | |

පිළිතුරු පත්‍රය 2014

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 1 | (2) 2 | (3) 1 | (4) 3 | (5) 1 | (6) 3 | (7) 1 | (8) 2 |
| (9) 2 | (10) 3 | (11) 2 | (12) 1 | (13) 1 | (14) 1 | (15) 3 | (16) 2 |
| (17) 3 | (18) 4 | (19) 1 | (20) 2 | (21) 4 | (22) 4 | (23) 1 | (24) 3 |
| (25) 3 | (26) 3 | (27) 3 | (28) 4 | (29) 4 | (30) 1 | | |

පිළිතුරු පත්‍රය 2013

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 2 | (2) 4 | (3) 1 | (4) 4 | (5) 1 | (6) 2 | (7) 2 | (8) 3 |
| (9) 2 | (10) 4 | (11) 2 | (12) 1 | (13) 3 | (14) 3 | (15) 4 | (16) 3 |
| (17) 2 | (18) 2 | (19) 1 | (20) 1 | (21) 4 | (22) 4 | (23) 4 | (24) 3 |
| (25) 3 | (26) 1 | (27) 3 | (28) 3 | (29) 2 | (30) 3 | | |

පිළිතුරු පත්‍රය 2012

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 3 | (2) 2 | (3) 4 | (4) 2 | (5) 3 | (6) 4 | (7) 3 | (8) 2 |
| (9) 2 | (10) 3 | (11) 1 | (12) 3 | (13) 2 | (14) 4 | (15) 4 | (16) 2 |
| (17) 1 | (18) 2 | (19) 3 | (20) 1 | (21) 2 | (22) 4 | (23) 4 | (24) 2 |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (25) 4 | (26) 2 | (27) 1 | (28) 4 | (29) 1 | (30) 3 | | |

<u>පිළිතුරු පත්‍රය 2011</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 4 | (2) 1 | (3) 2 | (4) 4 | (5) 2 | (6) 4 | (7) 2 | (8) 4 |
| (9) 4 | (10) 4 | (11) 4 | (12) 4 | (13) 1 | (14) 1 | (15) 1 | (16) 2 |
| (17) 1 | (18) 1 | (19) 4 | (20) 1 | (21) 3 | (22) 4 | (23) 2 | (24) 2 |
| (25) 2 | (26) 3 | (27) 2 | (28) 2 | (29) 2 | (30) 1 / 2 | | |

<u>පිළිතුරු පත්‍රය 2010</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 3 | (2) 4 | (3) 4 | (4) 3 | (5) 1 | (6) 1 | (7) 2 | (8) 4 |
| (9) 3 | (10) 4 | (11) 2 | (12) 2 | (13) 1 | (14) 4 | (15) 3 | (16) 3 |
| (17) 4 | (18) 2 | (19) 1 | (20) 1 | (21) 2 | (22) 1 | (23) 2 | (24) 4 |
| (25) 3 | (26) 2 | (27) 1 | (28) 3 | (29) 2 | (30) 4 | | |

<u>පිළිතුරු පත්‍රය 2009</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 4 | (2) 3 | (3) 2 | (4) 3 | (5) 4 | (6) 3 | (7) 4 | (8) 3 |
| (9) 2 | (10) 2 | (11) 4 | (12) 3 | (13) 2 | (14) 2 | (15) 3 | (16) 2 |
| (17) 4 | (18) 3 | (19) 2 | (20) 2 | (21) 2 | (22) 1 | (23) 2 | (24) 2 |
| (25) 4 | (26) 3 | (27) 2 | (28) 2 | (29) 3 | | | |

<u>පිළිතුරු පත්‍රය 2008</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) 3 | (2) 2 | (3) 4 | (4) 1 | (5) 3 | (6) 2 | (7) 3 | (8) 3 |
| (9) 4 | (10) 2 | (11) 2 | (12) 4 | (13) 2 | (14) 1 | (15) 3 | (16) 2 |
| (17) 2 | (18) 1 | (19) 1 | (20) 3 | (21) 3 | (22) 3 | (23) 2 | (24) 4 |
| (25) 2 | (26) 4 | | | | | | |

2019 සිට 2008 තෙක් පරිසරය ආශ්‍රිත කෙටි ප්‍රශ්න මෙහි එක පෙළට අන්තර්ගත වේ. විෂය නිර්දේශය වෙනස් වුව ද පරිසරය වැනි විෂයක දී එතරම් වෙනසක් සිදු නොවේ. ඒ අනුව මෙය පැරණි නිර්දේශය වුව ද ළමුන්ට නව නිර්දේශයේ ඇතුළත් කරුණු ද පවතින බව පෙනේ.

(පිළිතුරුවල යම් දෝෂයක් ඇතොත් නිවැරදි කර ගන්න.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com